# ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
# இலங்கை சமுத்திரப் பல்கலைக்கழகம்
# The Ocean University of Sri Lanka

# 2024

## වාර්ෂික වාර්තාව
## வருடாந்த அறிக்கை
## Annual Report


අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
වෘත්තීය අධ්‍යාපන අංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு,
தொழிற் கல்வி பிரிவு
Ministry of Education, Higher Education and Vocational Education.
Vocational Education Division

# වාර්ෂික වාර්තාව හා ගිණුම්

# ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය

# 2024

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
වෘත්තීය අධ්‍යාපන අංශය


කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15.

දුරකථන - 011-4346973 ෆැක්ස් - 011-2525103

විද්‍යුත් තැපැල : oceanuniversity@ocu.lk

වෙබ් අඩවිය: www.ocu.lk

# පටුන

01. දැක්ම, මෙහෙවර ප්‍රකාශය

02. පාලන මණ්ඩලය /ශාස්ත්‍රීය සභාව සහ ප්‍රධාන කළමණාකාරිත්වය

03. උපකුලපති පණිවුඩය

04. දළ විශ්ලේෂණය

**04.1** ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය, විකාශය සහ අරමුණු

**04.2** ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ, කාර්යභාරය සහ සේවා දායකත්වය

05. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - කාර්ය සාධනය **2024**

**05.1** අධ්‍යයන අංශ

**05.1.1** උසස් අධ්‍යයන

**05.1.2** වෘත්තීය තාක්ෂණ

**05.2** විශ්වවිද්‍යාල සමාජීය වගකීම් - ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්

**05.3** විශ්වවිද්‍යාල පාලනය

**05.4** පාලන අංශ ප්‍රගතිය

**05.5** අභ්‍යන්තර විගණන අංශය

06. අවදානම් කළමනාකරණය

07. විගණන හා කළමනාකරණ කමිටුව - කාර්ය සාධනය **2024**

08. විශ්ලේෂණාත්මක මූල්‍ය හා මෙහෙයුම් කාර්ය සාධනය **2024**

09. විගණිත මූල්‍ය ප්‍රකාශන

10. විගණකාධිපති වාර්තාව

11. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

12. මූල්‍ය විග්‍රහය - **2014 – 2023** වසර **10** ක කාලසීමාව

# 01. දැක්ම, මෙහෙවර ප්‍රකාශය

## *දැක්ම*

***සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර අංශ සඳහා නව්‍ය විසඳුම් ලබාදීම.***

## *මෙහෙවර*

***කලාපයේ සමුද්‍ර හා ධීවර අධ්‍යාපනයේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය වීම.***

## *විශ්වවිද්‍යාලයේ අරමුණු*

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 11 වන කොටසේ විශ්වවිද්‍යාලය ස්ථාපිත කිරීමේ අරමුණු පහත අයුරින් දක්වා ඇත.

1. ධීවර ,සමුද්‍ර විද්‍යා, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා දීම සඳහා විධිවිධාන සැලැස්වීම.

2. යම් ප්‍රදේශයක මිනිස්බල අවශ්‍යතා සපුරාලීම අරභයා ධීවර හා සමාන ක්ෂේත්‍රවලට අදාළ වෘත්තීය සහ තාක්ෂණික අධ්‍යාපන පාඨමාලා සඳහා අවස්ථා ලබා දීම.

3. ධීවර හා සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන් අතර ධීවර, සමුද්‍ර සහ සමුද්‍රීය අංශවලට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම.

4. ධීවර, සාගර විද්‍යාත්මක,සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය උදෙසා ව්‍යාප්ත පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම.

5. විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ධීවර හා සමාන ක්ෂේත්‍රවල සේවක මඩුලු සඳහා වෘත්තීය සහ තාක්ෂණික පාඨමාලා සැපයීම.

6. ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට ඇති දක්ෂතාවය සහ හැකියාව මත පදනම්ව ඉංජිනේරු ශිල්පය, විද්‍යාත්මක, තාක්ෂණික සහ වෘත්තිමය අධ්‍යාපනය සහ පුහුණුවීමේ පද්ධති යන ක්ෂේත්‍රවල ප්‍රගති සංවර්ධනය සඳහා විධිවිධාන සැළැස්වීම.

7. ජාතික වෘත්තීයමය සුදුසුකම් ඇති තැනැත්තන් සඳහා අධ්‍යාපන පාඨමාලා සඳහා විධිවිධාන සැලසීම සහ ධීවර, සාගර විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල ඔවුන්ගේ ප්‍රවීනත්වය වැඩි දියුණු කිරීම සඳහා සහ ශාස්ත්‍රීය සුදුසුකම් අත්කර ගැනීම සඳහා ඔවුන්ට සහාය වීම.

# 02. පාලන මණ්ඩලය

2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 19 (1) උප වගන්තිය යටතේ පාලන මණ්ඩලය ස්ථාපිතය.

| | | |
|---|---|---|
| | **නිල බලයෙන් පත්වන** | |
| 01. | මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා | සභාපති: උපකුලපති |
| 02. | ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා | පීඨාධිපති, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය |
| 03. | ආචාර්ය ඩබ්.ජේ.ජේ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය | පීඨාධිපති ,ධීවර හා සාගර විද්‍යා පීඨය |
| 04. | 1. පී.යූ.අයි. පෙරේරා මහතා | අධ්‍යක්ෂ පුහුණු (2024 මැයි මස දක්වා) |
| | 2. එල්.ජේ.කේ.සී.කේ. ලියනාරච්චි මහතා | අධ්‍යක්ෂ පුහුණු (වැ.බ.) (2024 ජූනි මස සිට) |
| 05. | එස්. එම්.එස්.ඩී. ගුණසිංහ මහතා | අධ්‍යක්ෂ (සැපයුම් හා ප්‍රසම්පාදන),<br>නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය. |
| 06. | එච්.පී. සෝමතිලක මහතා | අධ්‍යක්ෂ, ජාතික සැළසුම් දෙපාර්තමේන්තුව. |
| 07. | 1. පී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා | අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන) ,<br>අධ්‍යාපන අමාත්‍යාංශය (2024 ජනවාරි දක්වා) |
| | 2. ඩබ්.ආර්.පී.යූ. නුවන්ති මෙනවිය | සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන),<br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, (2024 පෙබරවාරි සිට) |
| 08 | පී. ආර්. අජිත් විජේසිංහ මහතා | අධ්‍යක්ෂ ජනරාල්,<br>වෙළඳ නාවික ලේකම් කාර්යාලය (2024අගෝස්තු මස සිට) |
| 09. | 1. ඉංජිනේරු සනත් පනාවෙන්නගේ මහතා | අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරි, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී ක්ලාක් ආයතනය (2024 ජූනි මස දක්වා) |
| | 2. කේ.ආර්. උඩුවාවල මහතා | අතිරේක ලේකම් (සංවර්ධන හා නව නිපැයුම්),<br>නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය (2024 අගෝස්තු මස සිට) |
| 10. | ආර්.ජේ.ඩී.එස්. රණතුංග මහතා | අතිරේක ලේකම්<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය |
| 11. | 1. එයාර් වයිස් මාර්ෂල් (විශ්‍රාමික) ප්‍රසන්න රණසිංහ මහතා | සභාපති, (2024 මාර්තු මස දක්වා)<br>වෘත්තීය පුහුණු අධිකාරිය |
| | 2. එස්.කේ. රාජපක්ෂ මහතා | සභාපති, (2024 මැයි මස සිට)<br>වෘත්තීය පුහුණු අධිකාරිය |
| 12. | 1. මහාචාර්ය ජයන්ත විජේරත්න මහතා | සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (2024 ජනවාරි මස දක්වා) |
| | 2. ආචාර්ය එන්.සී. කුමාරසිංහ මහතා | සභාපති, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (2024 ජූනි මස සිට) |
| 13. | ඩබ්. රුවික අමරසේකර මහතා | සභාපති,<br>ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (2024 ජනවාරි මස දක්වා) |
| 14. | ආචාර්ය කේ.ඒ. ලලිතධීර මහතා | අධ්‍යක්ෂ ජනරාල්,<br>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| | **පත්කළ සාමාජික** | |
| 15. | මහාචාර්ය පී. ආර්.ටී. කුමාරණතුංග මහත්මිය | පාලන මණ්ඩල සාමාජික |
| 16. | ආචාර්ය එන්.පී.ජී. පුෂ්පිත මහතා | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්, ශ්‍රීලංකා සාගර විශ්වවිද්‍යාලය (2024 ජූනි මස සිට) |
| 17. | ආචාර්ය එස්.එන්. දූෂානි මහ්මිය | ජ්‍යෝෂ්ඨ කථිකාචාර්, ශ්‍රීලංකා සාගර විශ්වවිද්‍යාලය (2024 අගෝස්තු මස සිට) |
| 18. | ජේ.එම්.වයි.එස්.ජේ. බණ්ඩාර මහත්මිය | පාලන මණ්ඩල සාමාජික |
| 19. | ආරියසීල වික්‍රමනායක මහතා | පාලන මණ්ඩල සාමාජික |
| 20. | හේමන්ත රත්නායක මහතා | ලේකම්: ලේඛකාධිකාරී (2024 ජූනි මස දක්වා) |

# ශාස්ත්‍රීය සභාව

2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 24 (1) උප වගන්තිය යටතේ ශාස්ත්‍රීය සභාව පිහිටුවා ඇත.

| | | |
|---|---|---|
| 01. | මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා | සභාපති : උපකුලපති,<br>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 02. | ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා | පීඨාධිපති,ඉංජිනේරු හා කළමනාකරණ පීඨය,<br>අධ්‍යක්ෂ - ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව |
| 03. | ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය | පීඨාධිපති, ධීවර හා සාගර විද්‍යා පීඨය,<br>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 04. | 1. පී.යූ.අයි. පෙරේරා මහතා | අධ්‍යක්ෂ පුහුණු (2024 මැයි මස දක්වා) |
| | 2. එල්.ඒ.කේ.සී.කේ. ලියනාරච්චි මහතා | අධ්‍යක්ෂ පුහුණු (වැ.බ.) (2024 ජුනි මස සිට) |
| 05. | හේමන්ත රත්නායක මහතා | ලේකම්: ලේඛකාධිකාරී, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (2024 ජුනි මස දක්වා) |
| 06. | එච්.කේ.ආර්. තුෂාර මහතා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (විභාග) / අධ්‍යක්ෂ - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය,<br>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 07. | ආචාර්ය එම්.පී. කුමාර මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, / අධ්‍යක්ෂ - ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි කමිටුව, ධීවර හා සමුද්‍රීය විද්‍යා අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 08. | 01.ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා | අංශ ප්‍රධානී, සාගර විද්‍යා විද්‍යාවේදී උපාධි අංශය,<br>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (2024 මාර්තු මස දක්වා) |
| | 02.ඩබ්.ඒ.ඒ.පී. විජේසුන්දර මහත්මිය | අංශ ප්‍රධානී, සාගර විද්‍යා විද්‍යාවේදී උපාධි අංශය,<br>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (2024 ජුනි මස සිට) |
| 09. | ආචාර්ය එන්.පී.ජී. පුෂ්පිත මහතා | අංශ ප්‍රධානී, ධීවර හා සමුද්‍රීය විද්‍යාවේදී උපාධි අංශය,<br>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 10. | ඉංජිනේරු අයි.සී. කිරින්දෙගෙදර මහත්මිය | අංශ ප්‍රධානී, නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 11. | 1. බී.ඒ.එන්. ඉන්දිකා මහත්මිය | අංශ ප්‍රධානී, ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (2024 මාර්තු මස දක්වා) |
| | 2. ආචාර්ය එච්.එම්.එස්.එම්. විජේරත්න මහතා | අංශ ප්‍රධානී, ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය (2024 මැයි මස සිට) |
| 12. | එම්.සී.එල් .සොයිසා මහත්මිය | අංශ ප්‍රධානී, වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණ උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 13. | එච්.ඩී.එම්.එම්. පුස්සැල්ල මහත්මිය | අංශ ප්‍රධානී, නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 14. | ආචාර්ය එච්.බී. ජයසිරි මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,සාගර විද්‍යා විද්‍යාවේදී උපාධි අංශය/ අධ්‍යක්ෂ - පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය,<br>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 15. | ආචාර්ය එම්.එෆ්.එම්. ෆයිරෝස් මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ධීවර හා සමුද්‍රීය විද්‍යා අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 16. | ආචාර්ය එස්. නේශා දූශානි මහත්මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ධීවර හා සමුද්‍රීය විද්‍යා අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 17. | ආචාර්ය කේ.කේ.ටී. නුවන්සි මහත්මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි අංශය, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය |
| 18. | පී.ඒ.එස්.ඒ. රත්න ශ්‍රී මහත්මිය | කථිකාචාර්ය, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය |
| 19. | සමුදිතා ගනේපොල මෙනවිය | කථිකාචාර්ය, ඉංජිනේරු හා කළමනාකරණ පීඨය |

# ප්‍රධාන කළමණාකාරිත්වය

2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ iv වන කොටසේ විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා සහ නිලධරයන් පිළිබඳ සඳහන් වේ. ඒ අනුව, 2024 වසරේදී විශ්වවිද්‍යාලයීය ප්‍රධාන කළමණාකාරිත්වය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| *01.* | *කුලපති* | *මහාචාර්ය ඔස්කා අමරසිංහ මහතා* |
| | | |
| *02.* | *උපකුලපති* | *මහාචාර්ය ආර්.එම්. වසන්ත රත්නායක මහතා* |
| | | |
| *03.* | *පීඨාධිපති (ඉංජිනේරු හා කළමනාකරණ පීඨය)* | *ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා* |
| | | |
| *04.* | *පීඨාධිපති (ධීවර හා සාගර විද්‍යා පීඨය)* | *ආචාර්ය ඩබ්.ජේ.ජේ.ඩී. ලංකා වික්‍රමසිංහ මහත්මිය* |
| | | |
| 05. | *ලේඛකාධිකාරී* | *ආර්.එස්. හේමන්ත රත්නායක මහතා - (2024.06 මස දක්වා)* |
| | | |
| *06.* | *අධ්‍යක්ෂ මුදල්* | *පී.ජේ.එස්. නලීන්. ආර්. පෙරේරා මහතා* |
| | | |
| *07.* | *අධ්‍යක්ෂ, ඇතුළත් කිරීම්, ප්‍රතිතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව* | *ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස මහතා* |
| | | |
| *08.* | *අධ්‍යක්ෂ පුහුණු (වැ.බ.)* | *එල්.ජේ.කේ.සී.කේ. ලියනාරච්චි මහතා* |
| | | |

# 03. උපකුලපති පණිවුඩය



ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වසර හතරකට ආසන්න වන ධූර කාලය තුළ විශ්වවිද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාව සඳහා සාධනීය ලක්ෂණයන්ගෙන් යුතු වර්ධන අවස්ථාවන් ඇතුළත්ව උපකුලපති පණිවුඩය නිකුත් කිරීමට ලැබීම සතුට දනවන කරුණකි.

සාගර විශ්වවිද්‍යාලයීය දැක්ම මෙහෙවර සනාථ කෙරෙන මූලික අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා උසස් අධ්‍යයන සහ වෘත්තීය තාක්ෂණ අංශයන්හි උපාධිලාභී සහ ඩිප්ලෝමාධාරී ශිෂ්‍ය කණ්ඩායම් සඳහා උපාධි සහ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය වසර තුළදී පැවැත්වීමට ලැබීම භාග්‍යයක් ලෙස සලකමි.

වසර තුළදි උසස් අධ්‍යයන අංශය, දූරස්ථ අධ්‍යයන සහ පශ්චාත් උපාධි අධ්‍යයන අංශ යටතේ උපාධි පාඨමාලාවන් සඳහා ශිෂ්‍ය ධාරිතාවය වර්ධනය කරමින් ශිෂ්‍ය බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කරන ලදි. එමෙන්ම අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍ය බඳවාගැනීම් කටයුතු මාර්ගස්ථ ක්‍රමවේදය භාවිතයෙන් සිදුකිරීම මගින් ඩිජිටල්කරණය විශ්වවිද්‍යාලය තුළ භාවිතය සනාථ කෙරේ. උසස් අධ්‍යයන උපාධි පාඨමාලාවන් හි ගුණාත්මක භාවය ප්‍රශස්ථ තත්ත්වයකට ගෙන ඒම උදෙසා ප්‍රමිතිගත ජාත්‍යන්තර ආයතනයන් හි සම්මතකරණයන් යටතේ උපාධි පාඨමාලවන් ක්‍රියාත්මක කිරීම 2024 වසර තුළදී සිදුකෙරිණි. නාවික ක්ෂේත්‍රයේ සංධිස්ථානයක් සනිටුහන් කරමින් විශ්වවිද්‍යාලයීය නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාව යටතේ අඛණ්ඩ මුදාහැරීමේ සහතික (Continues Discharge Certificate) ලබා දීම තුළ ඉතිහාසයේ පළමු කාන්තා කැඩෙට් නිළධාරිණිය බිහි කිරීමට හැකිවීම අප විශ්වවිද්‍යාලය ලද ජයග්‍රහණයක් ලෙස සටහන් තබනුයේ හදපිරි සතුටිනි.

විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශය තුළ ක්‍රියාත්මක අභ්‍යන්තර උපාධි පාඨමාලාවන් අතරට සමුද්‍රීය ජෛව තාක්ෂණවේදය සහ සමුද්‍රීය කටයුතු පිළිබඳ නව විද්‍යාවේදී උපාධි පාඨමාලාවන් හඳුන්වා දීම සඳහා විෂය නිර්දේශ 2024 වසර තුළදී සකසා අවසන් කර 2025 වසර තුළදී ශිෂ්‍ය බඳවාගැනීම් කටයුතු සැලසුම් කරන ලදි.

උසස් අධ්‍යයන අංශයේ ශිෂ්‍ය ශිෂ්‍යයාවන් සඳහා ද රේඛීය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක **"නිපුණතා සිසු සවිය"** ශිෂ්‍යාධාර ලබා දීමේ වැඩසටහන වසර තුළදී ආරම්භ කරන ලදි.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය තාක්ෂණ අංශයේ ප්‍රගමනය උදෙසා ප්‍රථම වරට පෙර දැනුම් ඇගයීමේ ක්‍රමය(Recognition of Prior Learning) යටතේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් යාපනය සහ ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් නිකුත් කිරීමට ලැබීම, ශ්‍රමික ප්‍රජාව උදෙසා සම්මතකරණයෙන් යුතු වෘත්තිමය හැකියා තහවුරුව ලබාදීමක් ලෙස දක්වන අතර 2025 වසර තුළදී සියළු ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් මෙම ක්ෂේත්‍රය ආවරණය කිරීම අරමුණු කෙරේ. එසේම වෘත්තීය තාක්ෂණ අංශයේ ශිෂ්‍ය ප්‍රජාව වෘත්තීය ජීවිතය තුළ සමාජයට වැඩදායක පුරවැසියන් ලෙස ශ්‍රී ලංකීය ආර්ථිකයට දායක කිරීම උදෙසා වෘත්තීය තාක්ෂණ අංශය තුළ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයක් (Career Guidance Unit) ස්ථාපිත කිරීම ද වසර තුළදී සිදුකෙරිණි.

වෘත්තීය තාක්ෂණ ක්ෂේත්‍රය සඳහා මූලික තාක්ෂණ දැනුම ලබා දීමේ පරමාර්ථයෙන් යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ දී මුහුදු කූඩැල්ලන් වගා කිරීමේ (Basic Technology of Sea Cucumber Culture) සහ මුහුදු පැළෑටි

වගා කිරීමේ මූලික තාක්ෂණ (Basic Technology of Seaweed Culture) පාඨමාලාවන් වසර තුළදී ආරම්භ කිරීම, ශ්‍රී ලංකා ආරථිකයට විදෙස් විනිමය ලබා ගැනීමේ මාර්ග විවෘත කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වූ අවස්ථාවක් ලෙස සතුටින් සඳහන් කරමි.

යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ කටයුතු පුළුල් කිරීම සඳහා යාපනයේ කල්ලුන්දායි ප්‍රදේශයේ රජයේ ඉඩම් අක්කර 02 ක භූමි ප්‍රදේශයක් සාගර විශ්වවිද්‍යාලය වෙත නිදහස් කර ගැනීමට හැකිවීම වසර තුල තබන ලද ඉදිරි පියවරක් ලෙස සටහන් තැබිය යුතු වේ.

වෘත්තීය තාක්ෂණ අංශයට අයත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන ස්ථාපිත ඉඩම් වල අයිතිය විශ්වවිද්‍යාලය වෙත පවරාගැනීම් කටයුතු 75% ක පමණ ප්‍රමාණයක් සම්පූර්ණ කිරීමට වසර තුළදී අවකාශ ලැබීමද වෘත්තීය තාක්ෂණ අංශයේ අභිවෘද්ධිය සඳහා හේතු කාරණා වන බව විශ්වාස කරමි.

ජාතික විගණන කාර්යාලය විසින් විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රකාශන සඳහා තත්ත්වාගණනය කළ විගණික මතයක් ප්‍රකාශ කිරීම විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රතිපාදන කළමනාකරණය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව තුළ ක්‍රමවේදගතව සිදුකර ඇති බවට නිරූපණය කෙරේ. විශ්වවිද්‍යාලයේ 2024 වසර තුල ප්‍රාග්ධන ප්‍රතිපාදන උපරිම යෙදවීම සටහන් වනුයේ 86% කට ආසන්න ප්‍රගති තත්ත්වයක් මූල්‍ය අංශය ළඟාකර ගැනීම තුලිනි.

වසර තුළදී සාගර විශ්වවිද්‍යාලයේ පරිපාලන කළමනාකරණ පද්ධති දෝෂ සහගත තත්ත්වයන් අවම කර කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයන් තුළට අනුගත කිරීම සඳහා විශ්වවිද්‍යාලයීය විගණන අංශය රේඛීය අමාත්‍යංශය හා රජයේ විගණන අංශය සමඟ සම්බන්ධීකරණයෙන් දක්වන ලද සහයෝගය විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණකි.

විශ්වවිද්‍යාල පරිපාලන ක්‍රමවේදය 2024 වසර තුළදී සාර්ථක කරගැනීම සඳහා ක්‍රියාකාරීව දායකත්වය සැපයූ පාලන මණ්ඩලයට, ශාස්ත්‍රීය සභාවට, විගණන හා කළමනාකරණ කමිටුවට, මූල්‍ය කමිටුවට සහ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට ද මාගේ කෘතඥතාවය මෙම අවස්ථාවේ පලකළ යුතුම බව මා විශ්වාස කරමි.

විශ්වවිද්‍යාලයේ ශක්තීන් උපරිම භාවිතයෙන් සහ සමස්ථ කාර්ය මණ්ඩල පූර්ණ කැපකිරීම් සහිත සක්‍රීය දායකත්වයක් සහිතව 2025 වසර සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට නායකත්වය ලබාදීම පෙරදැරිව මෙම සටහන නිමා කරමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ත රත්නායක, PhD.
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
මට්ටක්කුලිය
කොළඹ 15.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නීතිඥ වසන්ත රත්නායක, Ph.D

උපකුලපති,

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

# 04. දළ විශ්ලේෂණය

## 04.1 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය, විකාශය සහ අරමුණු




ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2014 අංක 31 දරණ පනත මඟින් ස්ථාපිත වී ශ්‍රී ලංකාවේ ධීවර,සාගර, සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා ධීවර,සාගර, විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන්ගේ විද්‍යාත්මක,තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දෙස් විදෙස් පිළිගත් උසස් අධ්‍යාපන දැනුමක් ලබා දීමේ ජාතික වගකීම ඉටු කරනු ලබන්නේය.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ ආවරණය වන අයුරින් විහිදුන ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08 ක වෘත්තීය පුහුණු අංශය ක්‍රියාත්මක වන අතර පීඨ 02 කින් සමන්විත වූ උසස් අධ්‍යයන අංශය ද එකතුව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ශ්‍රී ලාංකික ධීවර ක්ෂේත්‍රය, නාවික හා සාගරය පිළිබඳ පර්යේෂණ සඳහා අවශ්‍ය  මානව සම්පත සපයන කාර්යභාරයේ නිරත වේ.

2001 වර්ෂයේදී උපාධි පාඨමාලා ප්‍රදානය කිරීම ආරම්භ වීමත් සමඟ 2003 වසරේදී ධීවර හා සමුද්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී පාඨමාලාව ද, නාවික ඉංජිනේරු විද්‍යාවේදී පාඨමාලාව සහ යාත්‍රා ඉදිකිරීම් සහ නාවික වාස්තු විද්‍යාවේදී උපාධි පාඨමාලාව ද රජයේ පිළිගත් උපාධි පාඨමාලා වශයෙන් ගැසට් කර ප්‍රකාශයට පත් කරන ලදී. ක්‍රමිකව ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය තුළ වාණිජ හා කලා ඇතුළු සියලු විෂය ධාරාවන්ගෙන් උසස් පෙළ සමත් වන සිසුන්ට උසස් අධ්‍යයන අවස්ථා ලබා දීම පුළුල් කිරීම සඳහා විවිධ උපාධි පාඨමාලා හඳුන්වා දීම සිදු විය.

1999 වසරේදී පිහිට වූ ධීවර හා නාවික ඉංජිනේරු ආයතන පනත අහෝසි කරමින් 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනත සම්මත වූ අතර, 2015 වසරේදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස ස්ථාපනය වීමෙන් දූදරුවන්ට උසස් අධ්‍යයන වරම් සඳහා වැඩි ඉඩකඩක් විවෘත විය.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2023 වසරේදී දුරස්ථ අධ්‍යයන අවස්ථා පුළුල් කරමින් උපාධි පාඨමාලා 02 ක් හඳුන්වා දුන් අතරම, විශ්වවිද්‍යාලයේ ඉදිරි ගමන් මඟෙහි නවමු සටහනක් තබමින් පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය මඟින් විද්‍යාපති උපාධි පාඨමාලා ද ආරම්භ කරන ලදී.

2023 වසරේදී හඳුන්වා දුන් විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍ර උපාධි පාඨමාලා විශ්වවිද්‍යාලයීය උසස් අධ්‍යයන අංශයේ පරාසයන් පුළුල් කරමින් ශ්‍රී ලාංකීය ආර්ථික සංවර්ධනය සඳහා මානව සම්පත් සැපයීම ප්‍රමුඛ කොට ක්‍රියාත්මක වූ අතර සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර  කර්මාන්ත  ක්ෂේත්‍රයන් සඳහා නිපුණතා පූර්ණ ශ්‍රමික අවශ්‍යතාවයන් ඉලක්ක කර මෙම පාඨමාලා හඳුන්වා දෙන ලදී.

# ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ආරම්භය, විකාශය සහ අරමුණු

**උසස් අධ්‍යයන අංශය**

- **ධීවර හා සාගර විද්‍යා සහ ඉංජිනේරු සහ කළමනාකරණ පීඨ**
  - නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය - 2003
  - ධීවර හා සමුද්‍රීය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය - 2003
  - නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය - 2014
  - වෙරළ සහ නාවික සම්පත් කළමනාකරණ උපාධිය - 2015
  - සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය - 2019
  - ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය - 2020
- **දුරස්ථ අධ්‍යයන උපාධි කේන්ද්‍රය - 2023**
  - සැපයුම් දාම කළමනාකරණ
  - ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී
- **පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය - 2023**
  - වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය

| වෘත්තීය තාක්ෂණ අංශය |
|---|
| ප්‍රාදේශීය මධ්‍යස්ථාන |



## 04.2 ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය හා සේවා දායකත්වය

### ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ කාර්යභාරය:

ශ්‍රී ලංකාවේ ධීවර,සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සහ ධීවර, සාගර විද්‍යාත්මක,සමුද්‍රීය තාක්ෂණ සහ සමාන ක්ෂේත්‍රවල නියැලි සිටින තැනැත්තන්ගේ විද්‍යාත්මක තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම සහ එකී ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා මඟින් ලබාගන්නා උසස් අධ්‍යාපන සුදුසුකම් දේශීය හා විදේශීය පිළිගැනීම සහතික වීම හා දෙනු ලබන දැනුම රටේ සංවර්ධනය උදෙසා භාවිතයට ගැනීම.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය උසස් අධ්‍යයන අංශය සමන්විත වන පීඨ:

**ධීවර හා සාගර විද්‍යා පීඨය**
**තංගල්ල**

**ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය**
**මට්ටක්කුලිය**

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය පුහුණු අංශය යටතේ ක්‍රියාත්මක ප්‍රාදේශීය මධ්‍යස්ථාන 08:

| | |
|---|---|
| **තංගල්ල** | **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, මහවෙල පාර, තංගල්ල** |
| **ගාල්ල** | **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, 284/ ඒ, ගාලු පාර , බූස්ස, ගාල්ල** |
| **පානදුර** | **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,දොඹගහවත්ත,උයන්කැලේ පාර,පානදුර** |
| **මට්ටක්කුලිය** | **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කාකදූපත, මට්ටක්කුලිය, කොළඹ15.** |
| **මීගමුව** | **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය,වැල්ලවීදිය, මීගමුව** |
| **මඩකලපුව** | **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, නාවලඩි, මඩකලපුව** |
| **ත්‍රිකුණාමලය** | **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, කොඩ්ඩේ,චීන වරාය,ත්‍රිකුණාමලය** |
| **යාපනය** | **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය, දෙවන හරස් වීදිය,ගුරු නගර් ,යාපනය** |

### සේවා දායකත්වය

ධීවර, සාගර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මානව සම්පත් සංවර්ධන කාර්යයන්හි දී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය මඟින් පහත සඳහන් කණ්ඩායම් ආයතනයේ ඉලක්ක ගත කණ්ඩායම් ලෙස සලකා සේවා දායකත්වය සපයනු ලැබේ.



## ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය මධ්‍යස්ථාන



## 05. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - කාර්ය සාධනය 2024

සමුද්‍ර, සමුද්‍රීය හා ධීවර අංශ සඳහා නව්‍ය විසඳුම් ලබාදීම දැක්ම මූලිකව කලාපයේ සමුද්‍ර හා ධීවර අධ්‍යාපනයේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය වීමේ මෙහෙවර පෙරදැරිව 2014 අංක 31 දරන විශ්වවිද්‍යාල පනතේ අරමුණු සාක්ෂාත් කර ධීවර සහ සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරා ලීමේ කාර්යභාරය අරමුණු සහගතව 2024 වසරේ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වූ අංශයන්ගේ ප්‍රගතිය,

05.1. *අධ්‍යයන අංශ*

*05.1.1. උසස් අධ්‍යයන*

*05.1.2 වෘත්තීය තාක්ෂණ*

*05.2. විශ්වවිද්‍යාලයීය සමාජීය වගකීම් - ප්‍රජා සහභාගිත්ව වැඩසටහන්*

*05.3 විශ්වවිද්‍යාල පාලනය*

*05.4 පාලන අංශ ප්‍රගතිය*

*05.5 අභ්‍යන්තර විගණන අංශය*

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ත රත්නායක, PhD.
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
මට්ටක්කුලිය
කොළඹ 15.

.............................................

*ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිතිඳු වසන්ත රත්නායක,* **Ph.D**

*උපකුලපති,*

*ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.*

.............................................

*එල්.ඒ.කේ.සී.කේ.*
*ලියනාරච්චි මහතා*
*අධ්‍යක්ෂ පුහුණු (වැ.බ.),*
*ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.*

.............................................

*ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී. ලංකා වික්‍රමසිංහ*
*පීඨාධිපති,*
*ධීවර හා සාගර විද්‍යා පීඨය,*
*ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.*

Dr. W.A.A.D. Lanka Wickrmasinghe
BSc.(Hons) SL,MSc.VUB-Belgium,PhD.CIFE-India
Dean
Faculty of Fisheries and Ocean Sciences,
Ocean University of Sri Lanka,
Mattakkuliya, Colombo - 15

.............................................

*ආචාර්ය එස්.යූ. ප්‍රියන්ත ජිනදාස*
*පීඨාධිපති,*
*ඉංජිනේරු හා කළමනාකරණ පීඨය*
*ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.*

Dr. S.U.P. Jinadasa
Dean
Faculty of Engineering and Management
The Ocean University of Sri Lanka
Crow Island, Colombo 15.

# 05.1 අධ්‍යයන අංශ

## 05.1.1 උසස් අධ්‍යයන




2024 වසර තුළදී සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශය යටතේ ප්‍රථම උපාධි පාඨමාලා 06 ක්, තාක්ෂණවේදී උපාධි පාඨමාලාවක් ද ඇතුළත්ව අධ්‍යයන වර්ෂ කාණ්ඩයන් යටතේ ක්‍රියාත්මක විය. ධීවර හා සාගර විද්‍යා පීඨය යටතේ ධීවර හා සමුද්‍රීය විද්‍යා, සාගර විද්‍යා සහ ජලජීවි වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි පාඨමාලා පැවැත්වූ අතර, ඉංජිනේරු හා නාවික කළමනාකරණ පීඨය යටතේ නාවික ඉංජිනේරු, නාවික ප්‍රවාහනය සහ සැපයුම් කළමනාකරණ, වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධි පාඨමාලා ක්‍රියාත්මක විය.

වසර තුළ දී විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය මඟින් සැපයුම්දාම කළමනාකරණ හා ජලජීවි වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි පාඨමාලා දෙක (02) ද ,පශ්චාත් උපාධි අධ්‍යයන අංශය මඟින් වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව ද ක්‍රියාත්මක කෙරිණි.

2017 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලය විසින් පවත්වන උපාධි පාඨමාලාවන් ගාස්තු අයකිරීමෙන් නිදහස් කර ඇත. නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය හා ධීවර හා සමුද්‍රීය විද්‍යා විද්‍යාවේදී උපාධි පාඨමාලා සඳහා Z අගය (Z-Score) සහ අභියෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල පදනම්ව ද අනෙකුත් උපාධි පාඨමාලා සඳහා අභියෝග්‍යතා පරීක්ෂණ ප්‍රතිඵල මත ද ශිෂ්‍ය බඳවා ගැනීම් සිදු කෙරේ.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන අංශයේ උපාධි පාඨමාලා අභ්‍යන්තර බඳවා ගැනීම් මත පමනක් ක්‍රියාත්මක වූ අතර, 2023 වර්ෂයේ සිට බාහිර උපාධි පාඨමාලා ගාස්තු අයකිරීම් මත පවත්වා ගෙන යාමට කටයුතු කෙරිණි.

## වගුව අංක 1 - ශිෂ්‍ය ලියාපදිංචිය

| අනු අංකය | පීඨය | විද්‍යාවේදී උපාධි වැඩසටහන් | ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017/2018 | 2018/2019 | 2019/2020 | 2020/2021 | 2021/2022 | 2022/2023 | 2023/2024 | 2024/2025 |
| 01 | ඉංජිනේරු හා කළමනාකරණ | නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | 40 | 37 | 47 | 50 | 46 | 56 | 63 | **51** |
| 02. | | නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | 47 | 53 | 53 | 73 | 83 | 51 | 53 | 54 |
| 03. | | වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධිය | 40 | 45 | 55 | 65 | 54 | 49 | 54 | 50 |
| 04. | ධීවර හා සාගර විද්‍යා | ධීවර හා සමුද්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 41 | 41 | 49 | 59 | 68 | 49 | 53 | 58 |
| 05. | | සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය | | | 26 | 23 | 23 | 23 | 35 | 35 |
| 06. | | ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | | | | 40 | 76 | 65 | 70 | 60 |
| 07. | විවෘත හා දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | සැපයුම් දාම කළමනාකරණ උපාධිය | | | | | | | 86 | 69 |
| | | ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | | | | | | | 65 | 33 |
| 08. | පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය | වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ විද්‍යාපති උපාධිය | | | | | | | 15 | 8 |
| | | වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | | | | | | 05 | 2 |



වගුව අංක 2 - උපාධිය හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව

| | උපාධි පාඨමාලා | ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2017/2018 | 2018/2019 | 2019/2020 | 2020/2021 | 2021/2022 | 2022/2023 | 2023/2024 | 2024/2025 |
| 01. | නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | **7** | **13** | 33 | 43 | 37 | 56 | 58 | **51** |
| 02. | නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | **11** | **15** | **32** | **52** | 82 | 48 | **48** | **54** |
| 03. | වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධිය | **13** | **16** | **29** | **49** | 48 | 45 | **48** | **50** |
| 04. | ධීවර හා සමුද්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | | | **14** | **16** | 64 | **48** | 47 | **58** |
| 05. | සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය | | | **2** | 19 | 14 | **19** | **27** | **35** |
| 06. | ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | | | | **22** | 71 | 64 | 70 | **60** |
| 07. | **විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය** | | | | | | | | |
| | සැපයුම් දාම කළමනාකරණ උපාධිය | | | | | | | **76** | **66** |
| | ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | | | | | | | **65** | **31** |
| 08. | **පශ්චාත් උපාධි අධ්‍යයන කේන්ද්‍රය** | | | | | | | | |
| | දර්ශනසූරි | | | | | | | **1** | 1 |
| | දර්ශනපති | | | | | | | **1** | 1 |
| | වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ විද්‍යාපති උපාධිය | | | | | | | **10** | 8 |
| | වෙරළ සම්පත් සහ ආර්ථික විද්‍යාව සහ කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | | | | | | | 2 |

### 05.1.1.1 ආයතනික පුහුණුව සඳහා සිසුන් යොමු කිරීම.

ධීවර හා සමුද්‍රීය විද්‍යා උපාධි පාඨමාලාව හදාරා අවසන් වන සිසුන් පාඨමාලාව අවසානයේදී ආයතනික පුහුණුව සඳහා යොමු කරනු ලැබේ. එමගින් සිසුන් හට ක්ෂේත්‍රය හා සම්බන්ධ විවිධ ආයතනයන් සමග සම්බන්ධ වී කටයුතු කිරීමට හැකියාව ලැබේ.මෙම වසරේදී ද සිසුන් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ආයතනික පුහුණුව සඳහා යොමු කර ඇත.

### 05.1.1.2 අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය

වගුව අංක 3 - ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ ධීවර හා සාගර විද්‍යා පීඨයේ ආචාර්ය මණ්ඩලය

| *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්* | | |
|---|---|---|
| 01. | ආචාර්ය එම්. එෆ්. එම්. ෆයිරෝස් මහතා | B.Sc. (Ruhuna,SL), M. Phil (Ruhuna,SL), D. Sc (Shizuoka, Japan) |
| 02. | ආචාර්ය එම්. පී. කුමාර මහතා | B.Sc. (Hons), (Ruhuna, SL), Ph. D (Edinburgh Napier, UK) |

| | | |
|---|---|---|
| 03. | ආචාර්ය ඩබ්.ඒ.ඒ.ඩී.එල් වික්‍රමසිංහ මහත්මිය | B.Sc. (Hons) (Ruhuna, SL), M.Sc. (Vrije, Belgium) Ph.D. (ICAR-CIFE, Mumbai, India) |
| 04. | ආචාර්ය ජේ.කේ. රාජපක්ෂ මහතා | B.Sc. in Physical Science (Peradeniya, SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (Peradeniya, SL) |
| 05. | ආචාර්ය එස්. එන්. දූෂානි මහත්මිය | B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (UiT, Norway), Ph. D scholar (UiT, Norway) |
| 06. | ආචාර්ය එස්.පී.යූ. ජිනදාස මහතා | B.Sc. in Special in Geology (Peradeniya, SL), (MPhil) Applied Geophysics (Open University SL), Doctor of Philosophy Physical Oceanography (Ruhuna, SL) |
| 07 | ආචාර්ය එන්. පී. ජී. පුෂ්පිත මහතා | B.Sc. (Hons), (Ruhuna, SL) MPhil (Ruhuna, SL), M.Sc. (KMOU Korea), Ph.D. (Ruhuna, SL) |
| 08 | ආචාර්ය එච්.එම්.එස්.එම්.විජේරත්න මහතා | B.Sc in Fisheries and Marine Sciences (Ruhuna SL), M.Sc.(South Korea), PhD (South Korea) |
| 09 | ආචාර්ය කේ.කේ.ටී.නුවන්සි මිය. | Ph.D in Aquaculture (India), M.Sc (India), B.Sc (Hons) Ruhuna |
| 10 | ඩබ්.ඒ.ඒ.පී.විජේසුන්දර මිය. | B.Sc.Sabaragamuwa University), Post Graduate (Colombo SL), M.Sc (Colombo SL) |

| *කථිකාචාර්යවරුන්* | | |
|---|---|---|
| 01. | බී.ඒ. එන්. ඉන්දිකා මහත්මිය | B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (PNU,Korea) M.Sc. (Janardhanapuram, SL) |
| 02. | ඩබ්. ඒ. ඒ. යූ. කුමාර මහතා | B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (James Cook, Australia) |
| 03. | ටී.ඩබ්.එස්. වර්ණසූරිය මහතා | B.Sc. (Hons), (Ruhuna, SL), M.Sc. (Colombo, SL) |

**වගුව අංක 4 -ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ නාවික ඉංජිනේරු හා කළමනාකරණ පීඨයේ ආචාර්ය මණ්ඩලය**

| *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්* | | |
|---|---|---|
| 01. | ආචාර්ය එච්.බී.ජයසිරි මහතා (කොන්ත්‍රාත් පදනම) | B.Sc. in Biological Science (Ruhuna, SL), M.Sc. (Gothenburg, Sweden), Ph.D. (CIFE, Mumbai, India) |
| 02 | ඉංජිනේරු ඊ.පී. රොහාන් මහතා | B.Sc. in Engineering (Ruhuna,SL), MPhil (Ruhuna,SL), Doctor of Engineering (Ruhuna,SL) |
| 03 | එච්. ඩී.එම්.එම්.පුස්සැල්ල මහත්මිය | B.Sc. (Hons) in Business Administration (Peradeniya, SL), M.Sc. in Management university of Sri Jayawardhanapura |
| 04 | ටී.පී.ජී.එන්.අසන්ත ද අල්විස් මහතා | B.Sc. (Hons) in Transport & Logistics Management (Moratuwa, SL), Master of Science Korea Maritime and Ocean University |
| *කථිකාචාර්යවරුන්* | | |
| 01. | එම්.සී.එල් .සොයිසා මහත්මිය | B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL), Master of Science Korea Maritime and Ocean University |
| 02. | ඊ.ඒ.කේ.කේ. අමරසේකර මහත්මිය | B.Sc. in Fisheries Science (National Institute of Fisheries & Nautical Engineering, SL), M.Sc. in Aquaculture and Fisheries Management at Kelaniya, SL) |
| 03. | එච්.ඒ.පී.එස්.ජයපාල මහත්මිය | B.Sc. in Degree (Open SL), M.Sc. in Fisheries & Aquatic Resources Management (Sri Jayawardhanapura, SL), Master of Science Korea Maritime and Ocean University |
| 04. | පී.ඒ.එස්.ඒ. රත්න ශ්‍රී මහත්මිය | B.Sc. (Special) in Aquatic Science (Sri Jayawardhanapura, SL), M.Sc. in Environmental Science (Open University, SL) |
| 05. | ජී.ඒ.එස්. චතුරි ගනේපොල මෙනෙවිය | Master of Business Administration, University of Colombo, Bachelor of Business Administration in Business Economics, University of Colombo Passed Finalist in Charted Institute of Management Accountants (CIMA) |

| | | |
|---|---|---|
| 06. | ඩබ්.පී.ඩබ්.අංජලිකා මහත්මිය | B.A. in Economics (Special) Degree University of Sabaragamuwa |
| 07 | අයි.සී. කිරින්දගෙදර මහත්මිය | B.Sc. in Engineering (Peradeniya,SL), M.B.A. (Moratuwa,SL) |
| 08 | දිලිනි නවෝදයා විජේරත්න මෙනවිය | B.Sc. (Ocean University SL), |

### 05.1.1.3 අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කළ පර්යේෂණ හා ප්‍රකාශන 2024

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් යොමු ගත සුවිගත වාර සඟරා ලිපි සහ යොමු ගත සුවි ගත නොකළ වාර සඟරා ලිපි ප්‍රකාශයට පත් කර ඇත. කාර්ය මණ්ඩලයේ සියලුම ප්‍රකාශ පිළිබඳ සාරාංශයක් වගුවේ දක්වා ඇත.

**වගුව අංක 5 : අධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ පළ කිරීම්**

| පීඨය | | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය |
| | 1 | විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව | | | **6** |
| | 2 | විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත නොකළ යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව | | | |
| ධීවර හා සාගර විද්‍යා පීඨය | 3 | සම්මන්ත්‍රණ කාර්ය සටහන් | 3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව | | **2** |
| | | | 3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව | **25** | **12** |
| | 4 | පළ කළ ග්‍රන්ථ පරිච්ඡේද | | | **3** |
| | 5 | විශේෂඥ ක්ෂේත්‍රවල පළ කළ ග්‍රන්ථ/පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව | 5.1 ප්‍රකාශකයෙක් මඟින් | | |
| | | | 5.2 කතෘවරයෙක් මඟින් | | |
| | | | | | |
| | 1 | විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව | | | **2** |
| | 2 | විද්‍යුත් වාර සඟරා ඇතුළු සුවිගත නොකළ යොමු ගත වාර සඟරා වල පළකිරීම් සංඛ්‍යාව | | **1** | **2** |
| ඉංජිනේරු සහ කළමනාකරණ පීඨය | 3 | සම්මන්ත්‍රණ කාර්ය සටහන් | 3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව | **2** | **2** |
| | | | 3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව | **10** | |
| | 4 | පළ කළ ග්‍රන්ථ පරිච්ඡේද | | | **1** |
| | 5 | විශේෂඥ ක්ෂේත්‍රවල පළ කළ ග්‍රන්ථ/පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව | 5.1 ප්‍රකාශකයෙක් මඟින් | | |
| | | | 5.2 කතෘවරයෙක් මඟින් | | |

වගුව අංක 6 : අනධ්‍යයන කාර්ය මණ්ඩලය සිදු කළ පළ කිරීම්

| විධායක කාර්ය මණ්ඩලය | | ප්‍රකාශන කාණ්ඩය | | සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය |
| | 3 | සම්මන්ත්‍රණ කාර්ය සටහන් | 3.1 සම්පූර්ණ ලිපි වල පළ කළ ලිපි සංඛ්‍යාව | **2** | |
| | | | 3.2 සාරාංශ පළ කිරීම් සංඛ්‍යාව | | |

## 05.1.1.4 ප්‍රගතිය

❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ පස්වන උපාධි ප්‍රදානෝත්සවය 2024.11.20 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වා උපාධිලාභි සිසුන් 239 දෙනෙකු සඳහා උපාධි ප්‍රදානය සිදු කිරීම.





| | පීඨය | උපාධි පාඨමාලාව | සංඛ්‍යාව |
|---|---|---|---|
| 01. | ඉංජිනේරු හා කළමනාකරණ | නාවික ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය | 29 |
| | | නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ විද්‍යාවේදී උපාධිය | 69 |
| | | වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ උපාධිය | 46 |
| 02. | ධීවර හා සාගර විද්‍යා | ධීවර හා සමුද්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 63 |
| | | සාගර විද්‍යා විද්‍යාවේදී උපාධිය | 17 |
| | | ජලජීවී වගාව හා මුහුදු ආහාර පිළිබඳ තාක්ෂණවේදී උපාධිය | 15 |
| | එකතුව | | **239** |

❖ වෘත්තීය අධ්‍යාපනය සඳහා ප්‍රවිශ්ය වන සිසුන් සඳහා වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම අරමුණු කර ගනිමින් රැකියා විරහිත තරුණ ප්‍රජාව වෘත්තීය නිපුණත්වයෙන් බල ගන්වා වෘත්තීය අධ්‍යාපනය වෙත නැඹුරු කිරීමේ අපේක්ෂාවෙන් **"නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය"** ක්‍රියාත්මක වන අතර, ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය උසස් අධ්‍යයන අංශ සිසුන් 160 දෙනෙකු සඳහා ද 2024 වර්ෂයේ සිට **"නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර ක්‍රමය"** ක්‍රියාත්මක කිරීම.

❖ ජලජීවී වගාව සහ මුහුදු ආහාර තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධි (B.Tech in Aquaculture and Seafood Technology) පාඨමාලාවේ ප්‍රායෝගික පුහුණු කටයුතු සඳහා විද්‍යාගාර පහසුකම් සැපයීම අරමුණු කර Aquaculture and Anatomy Laboratory විද්‍යාගාරය 2024 ජූලි මස 18 වන දින ස්ථාපිත කිරීම.



❖ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාලයීය නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාවේ විෂය නිර්දේශය ප්‍රමිතිකරණය කිරීමේ වැඩමුළුවක් 2024 ජුනි මස 22 වන දින සියලු පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වීම. වැඩමුළුව සඳහා විශ්වවිද්‍යාල පද්ධතියේ නාවික ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන විශ්වවිද්‍යාල වන මොරටුව, කොතලාවල ආරක්ෂක, විවෘත, පේරාදෙණිය, කැළණිය සහ සිනෙක් විශ්වවිද්‍යාල දායකත්වය දක්වන ලද අතර, ක්ෂේත්‍රය නියෝජනය කරමින් කොළඹ නැව් තාටාකාංගනය, මාස්ටර් ඩයිවර්ස්, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය සහ ජොන් කීල්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය සහභාගී විය.

❖ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය ඉතිහාසයේ නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සම්බන්ධ සාර්ථක ඉදිරි පියවරක් ලෙස විශ්වවිද්‍යාලයීය නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාවේ පළමු කාන්තා කැඩෙට් නිලධාරිනිය පත්වීම නාවික ක්ෂේත්‍රයේ සංධිස්ථානයකි.



❖ සාගර විශ්වවිද්‍යාලයේ ප්‍රථම විදේශ ශිෂ්‍ය සහභාගිත්ව අධ්‍යයන දැනුම හුවමාරු වැඩසටහන කොරියා මැරිටයිම් සාගර විශ්වවිද්‍යාලය (Korea Maritime Ocean University) වෙරළ සහ සමුද්‍ර සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශ සිසුන් සමඟ ඒකාබද්ධව 2024 ජූලි මස 24 දින සිට 30 දක්වා කාලසීමාවේ පැවැත්වීම.

❖ ධීවර හා සාගර විද්‍යා පීඨයේ ධීවර හා සමුද්‍රීය අධ්‍යයන අංශය මඟින් සූර්ය වියලන භාවිතයෙන් ධීවර ප්‍රජාවට සහ පාරිභෝගික ජනතාවට සෞඛ්‍යාරක්ෂිතව හා ගුණාත්මකව වියළි මුහුදු ආහාර නිපදවීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම සහ අවශ්‍ය සූර්ය වියලන උපකරණ නිපදවීමට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම.



❖ ධීවර හා සාගර විද්‍යා පීඨයේ ධීවර හා සමුද්‍රීය අධ්‍යයන අංශය මඟින් දකුණු මුහුදු තීරයේ සංචාරක හෝටල් සම්බන්ධ කර ගනිමින් සාගර පරිසර පද්ධතිය සුරැකීමේ වැඩපිළිවෙලක් ලෙස මුහුදු තණකොළ (Sea Grass) වගා ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

❖ ධීවර හා සාගර විද්‍යා පීඨයේ ධීවර හා සමුද්‍රීය අධ්‍යයන අංශය ඇක්වාපොනික් තාක්ෂණය මඟින් තිරසාර මත්ස්‍ය හා භෝග වගා කිරීමේ මෙවලම් නිර්මාණය කිරීම හඳුන්වා දී ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.



❖ සාගර විද්‍යා අධ්‍යයන අංශය විසින් ජගත් සාගර දිනය 2024 ජුනි මස 7 දින සැමරීම සඳහා **"Catalyzing Action for Our Ocean & Climate"** තේමාව යටතේ වැඩසටහනක් සංවිධානය කර, සාගර සංරක්ෂණය සහ සමුද්‍රීය ක්ෂේත්‍රය ආශ්‍රිතව පවත්නා අවස්ථාව හඳුනා ගැනීම සහ වෙරළ තීරයේ සුරැකීම සඳහා සිදු කළ යුතු කාර්යයන් පිළිබඳ සිසුන් සහ කාර්යමණ්ඩල දැනුවත් කිරීම.

❖ මුහුදු ජෛව තාක්ෂණ උපාධි පාඨමාලාවේ (B.Sc. in Marine Biotechnology) විෂය මාලා සැකසීම් කටයුතු සිදු කිරීම.

## ජාත්‍යන්තර සහයෝගීතාවයන්

❖ ඇමෙරිකා එක්සත් ජනපදයේ නොටර්ඩෑම් විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අතර වසර 2024 සහ 2028 දක්වා පස් අවුරුදු කාලසීමාවක් සඳහා බෙංගාල බොක්ක සාගර සීමාවේ සාගර සහ වායුගෝලීය විද්‍යාව පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට 2024.06.12 දින අවබෝධතා ගිවිසුම් ගතවීම. ව්‍යාපෘතිය මඟින් අධ්‍යයන සංවර්ධනය, පර්යේෂණ සහ ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍ය ප්‍රජාවගේ කුසලතා වර්ධනය අරමුණු කෙරේ. නොටර්ඩෑම් විශ්වවිද්‍යාලය සහ වොෂින්ටන් විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය සඳහා ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් (USD) 62000 ක ඇස්තමේන්තුගත මුදලින් (USD) 60000 ක මූල්‍ය ආධාර ප්‍රදානය සිදු කරනු ඇත.

❖ සහයෝගී අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා චීන විද්‍යා ඇකඩමිය යටතේ පවතින දකුණු චීන මුහුදු සාගර විද්‍යා ආයතනය සමඟ විශ්වවිද්‍යාලය අවබෝධතා ගිවිසුමක් (MOU) සකස් කර ඇත. මෙම යෝජනාව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර,අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතී.

❖ චීනයේ සන් යැට් සෙන් (Sun Yat- Sen University) විශ්වවිද්‍යාලය සමඟ අධ්‍යයන හා පර්යේෂණ සබඳතා සඳහා ගිවිසුම් ගතවීමට විශ්වවිද්‍යාලය කටයුතු කිරීම.

## 05.1.2 වෘත්තීය තාක්ෂණ අංශය




ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය වෘත්තීය තාක්ෂණ අංශය ප්‍රාදේශියව ස්ථාපිත මධ්‍යස්ථාන 08 කින් සමන්විත වේ. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහිත පාඨමාලා ප්‍රාදේශිය මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කිරීම තුළ දසත විහිදුනු සිසු දරුදැරියන්ගේ වෘත්තීය අධ්‍යාපනය ඉහල නැංවීම සිදු කරනු ලැබේ.

### 05.1.2.1. 2024 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ වෘත්තීය තාක්ෂණ අංශ ප්‍රාදේශීය විද්‍යාල (08) පාඨමාලා ප්‍රගතිය

**වගුව අංක 07: 2024 වසර තුළ ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව :**

| අංශය | නිපුණතා සම්මත මට්ටම ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)/ ජාතික නොවන වෘත්තීය සුදුසුකම් (NNVQ) | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | | | | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | පූර්ණකාලීන | | අර්ධකාලීන | | |
| | | පිරිමි | ගැහැණු | පිරිමි | ගැහැණු | |
| ධීවර හා ජලජීවී වගාව | NVQ | 204 | 122 | 17 | 8 | **351** |
| | NNVQ | 374 | 2 | 31 | 19 | **426** |
| සමුද්‍ර හා නාවික විද්‍යාව | NVQ | 294 | 137 | 0 | 0 | **431** |
| | NNVQ | 82 | 0 | 0 | 0 | **82** |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | NVQ | 7 | 26 | 0 | 0 | **33** |
| ජංගම පුහුණු | NNVQ | 390 | 201 | 12 | 10 | **613** |
| **RPL** | NVQ | 53 | 0 | 0 | 0 | **53** |
| එකතුව | | **1404** | **488** | **60** | **37** | **1989** |

වගුව අංක **08: 2024.12.31** දිනට අධ්‍යාපනය ලබමින් සිටින ශිෂ්‍ය සංඛ්‍යාව:

| ප්‍රාදේශීය මධ්‍යස්ථානය | පාඨමාලාව | නිපුණතා සම්මත මට්ටම **NVQ level** | පාඨමාලා සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව | **2024.12.31** දිනට අධ්‍යාපනය ලබමින් සිටින ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **මීගමුව** | ජාතික ඩිප්ලෝමා | 5 | 5 | 148 | **294** |
| | සහතික පත්‍ර NVQ | 3 / 4 | 6 | 91 | |
| | සහතික පත්‍ර Non NVQ | - | 1 | 10 | |
| | ජංගම පුහුණු | - | 3 | 45 | |
| **ත්‍රිකුණාමලය** | ජාතික ඩිප්ලෝමා | 5 | 1 | 10 | **10** |
| | සහතික පත්‍ර | 3 / 4 | 0 | 0 | |
| | ජංගම පුහුණු | - | 0 | 0 | |
| **ගාල්ල** | උසස් ජාතික ඩිප්ලෝමා | 6 | 1 | 34 | **194** |
| | ජාතික ඩිප්ලෝමා | 5 | 2 | 62 | |
| | සහතික පත්‍ර NVQ | 3 / 4 | 5 | 80 | |
| | සහතික පත්‍ර Non NVQ | - | 1 | 18 | |
| | ජංගම පුහුණු | - | 0 | 0 | |
| **තංගල්ල** | උසස් ජාතික ඩිප්ලෝමා | 6 | 1 | 33 | **197** |
| | ජාතික ඩිප්ලෝමා | 5 | 4 | 103 | |
| | සහතික පත්‍ර NVQ | 3 / 4 | 2 | 31 | |
| | සහතික පත්‍ර Non NVQ | - | 0 | 0 | |
| | අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC) | STCW/ISO | 2 | 30 | |
| | ජංගම පුහුණු | - | 0 | 0 | |
| **යාපනය** | ජාතික ඩිප්ලෝමා | 5 | 2 | 33 | **55** |
| | සහතික පත්‍ර NVQ | 3 / 4 | 0 | 0 | |
| | ජංගම පුහුණු | - | 1 | 22 | |
| **මට්ටක්කුලිය** | ජාතික ඩිප්ලෝමා | 5 | 4 | 76 | **437** |
| | සහතික පත්‍ර | - | 0 | 0 | |
| | අඛණ්ඩ මුදා හැරීමේ සහතික පාඨමාලා - (CDC) | STCW/ISO | 2 | 50 | |
| | ජංගම පුහුණු | - | 2 | 311 | |
| **පානදුර** | ජාතික ඩිප්ලෝමා | 5 | 4 | 97 | **142** |
| | සහතික පත්‍ර NVQ | 3 & 4 | 1 | 11 | |
| | සහතික පත්‍ර Non NVQ | - | 1 | 23 | |
| | ජංගම පුහුණු | - | 1 | 11 | |
| **මඩකලපුව** | ජාතික ඩිප්ලෝමා | 5 | 1 | 20 | **79** |
| | සහතික පත්‍ර | 3 & 4 | 1 | 13 | |
| | ජංගම පුහුණු | - | 2 | 46 | |
| **2024.12.31දිනට අධ්‍යාපනය ලබමින් සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව** | | | **56** | **1408** | **1408** |

වගුව අංක 09: 2024 වසර තුළ නිකුත් කරන ලද සහතික පත්‍ර සංඛ්‍යාව

| නිපුණතා සම්මතයන් | නිකුත් කරන ලද සහතික පත්‍ර සංඛ්‍යාව ( 2024 දෙසැම්බර් 31 දක්වා ) |
|---|---|
| ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) | 334 |
| ජාතික වෘත්තීය සුදුසුකම් නොවන (Non NVQ) | 464 |
| ජාත්‍යන්තර ප්‍රමිතිකරණ ආයතන සුදුසුකම් (ISO) | 107 |
| ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් පෙර දැනුම් ඇගයීමේ ක්‍රමය යටතේ (RPL) | 52 |
| එකතුව | 957 |



## 05.1.2.2. ප්‍රගතිය

- ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය වෘත්තීය තාක්ෂණ අංශයේ ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි ඩිප්ලෝමා පාඨමාලා හදාරා ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 05 සම්පූර්ණ කරන ලද සිසුන් සඳහා තෙවන ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය 2024.11.20 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වා සිසුන් 206 දෙනෙකු සඳහා ඩිප්ලෝමා ප්‍රදානය සිදු කිරීම.




- ප්‍රාදේශීය මධ්‍යස්ථාන මගින් පවත්වන ලද පාඨමාලා සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් (NVQ) 387 ක් නිකුත් කර ඇති අතර, ජාතික වෘත්තීය සුදුසුකම් නොවන සහතිකපත් (Non NVQ) 563 ක ප්‍රමාණයක් නිකුත් කර ඇත.
- රේඛීය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක **"නිපුණතා සිසු සවිය"** ශිෂ්‍යාධාර ලබා දීමේ වැඩසටහන සමඟ සම්බන්ධීකරණයෙන් වෘත්තීය තාක්ෂණ අංශයේ ශිෂ්‍ය/ශිෂ්‍යාවන් සඳහා ශිෂ්‍යාධාර ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම.

- ශාස්ත්‍රීය මණ්ඩලයේ සහ පාලක මණ්ඩලයේ අනුමැතිය මත වෘත්තීය තාක්ෂණ අංශයේ ශිෂ්‍ය ප්‍රජාව උදෙසා වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයක් (Vocational Career Guidance Unit) ස්ථාපිත කර, ප්‍රාදේශීය මධ්‍යස්ථාන අට (08) සහ ප්‍රධාන කාර්යාලය නියෝජනය වන පරිදි නිලධාරීන් නව (09) දෙනෙකුහට විධිමත් පුහුණුවක් ලබා දීම. වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා රේඛීය අමාත්‍යාංශය විසින් "Career One" නමින් අන්තර්ජලය හරහා ක්‍රියාත්මක වන නව මෘදුකාංගයක් ස්ථාපනය සිදුකර වෘත්තීය පුහුණු ආයතන 70ක් සහ පෞද්ගලික අංශයේ ආයතන ද ඇතුලත්ව දීප ව්‍යාප්තව වෘත්තීය අධ්‍යාපනය ලද සිසුන් රැකියාගත කිරීම සඳහා හඳුන්වා දී ඇති නව වැඩපිළිවෙල සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ දායකත්වය ලබාදීම.



- ප්‍රාදේශීය මධ්‍යස්ථාන (ගාල්ල, යාපනය) විසින් පෙර දැනුම් ඇගයීමේ ක්‍රමය (RPL) යටතේ ස්කූබා කිමිදුම්කරු සහ ධීවර යාත්‍රා නියමු ශිල්පීන් (ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් - NVQ Level 04) සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් 53 ක් (NVQ) වසර තුළදී නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.




- 2024 වසර තුළදී යාපනය ප්‍රාදේශිය මධ්‍යස්ථානය සඳහා නව බිම් කොටසක් අත්පත් කර ගැනීම.






- යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් මුහුදු කූඩැල්ලන් වගා කිරීමේ මූලික තාක්ෂණ පාඨමාලාවක් සහ මුහුදු පැළෑටි වගා කිරීමේ මූලික තාක්ෂණ පාඨමාලාවක් ආරම්භ කිරීම.





- යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් "යාත්‍රා නිෂ්පාදනය සහ නඩත්තුව පිළිබඳ මූලික තාක්ෂණ" කෙටි කාලීන පාඨමාලාවක් හඳුන්වා දීම සඳහා විෂය නිර්දේශ සකස් කිරීම 2024 වසර තුල දී සිදු කිරීම.

- තංගල්ල සහ ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයන්හි නාවික ප්‍රවාහන සහ සැපයුම් කළමණාකරනය ඩිප්ලෝමාධාරී සිසුන් හම්බන්තොට ජාත්‍යන්තර වරායේ රැකියා ගත කිරීමට අවස්ථාවන් සළසාදීම.





# 05.2 විශ්වවිද්‍යාල සමාජීය වගකීම්

## ප්‍රජා සහභාගීත්ව වැඩසටහන්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් 2024 වසර තුළදී සමාජ වගකීම් ඉටු කිරීමේ කාර්යභාරය උදෙසා ප්‍රජා මූලික සමාජ සත්කාරක වැඩසටහන් උසස් අධ්‍යයන අංශය සහ වෘත්තීය තාක්ෂණ අංශයේ ප්‍රාදේශිය මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කිරීම පහත පරිදි වේ.

❖ <u>උසස් අධ්‍යයන අංශය</u>



01. පල්ලිය හා සම්බන්ධ වෙමින් ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් වල පාසල් දරුවන් සඳහා පාසල් උපකරණ බෙදා දීමේ වැඩසටහනක් පැවත්වීම . (2024/01/21)



02. ආගමික සහජීවනය වර්ධනය කිරීමේ අරමුණින් සියලු සිසුන් හා එක්ව අටවිසි බුද්ධ පූජා වැඩසටහනක් පැවැත්වීම.(2024/05/23)



03. ලෝක සාගර දිනයට සමගාමීව වෙරළ තීරය පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,(2024/06/08)



04. රුහිරු පාරිමී නමින් ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම (2024/12/03).

❖ <u>වෘත්තීය තාක්ෂණ අංශය</u>

1. තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් තංගල්ල වරායේ සිට හම්බන්තොට දිසාවට කි.මී. 01ක වෙරළ තීරය පවිත්‍රතා කිරීමේ වැඩසටහන දෙසැම්බර් මස දී ආරම්භ කිරීම. මෙය ජෛව විවිධත්වය ආරක්ෂාකර ගනිමින් ධීවර ප්‍රජාව, රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන සහ ව්‍යාපාරික ප්‍රජාවගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ අනුග්‍රහය ඇතිව අඛණ්ඩව පවත්වා ගෙන යෑම.





2. යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් වෘත්තීය පුහුණු පාඨමාලා පිළිබඳ තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.



3. තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය විසින් පිටත සවිකරන එන්ජින් අළුත්වැඩියාව සහ නඩත්තුව පිළිබඳව ජංගම වැඩසටහනක් 2024.10.22 තංගල්ල උණාකුරුව ප්‍රදේශයේදී ධීවර ප්‍රජාව උදෙසා නොමිලේ පවත්වා මුහුදු ගමන් සඳහා භාවිතා කරන ධීවර යාත්‍රා එන්ජින් අලුත්වැඩියාවන් සහ සේවා කිරීම අභ්‍යාසලාභීන් සහ කාර්යමණ්ඩල සහභාගීත්වයෙන් සිදු කිරීම.




4. යාත්‍රා සමබරතාවය රැකගනිමින් නිවැරදිව යාත්‍රාව හැසිරවීම පිළිබඳ ධීවරයින් ප්‍රායෝගිකව දැනුවත් කිරීමේ එක් දින වැඩසටහනක් 2024.12.16 දින තංගල්ල වෙරළ දී පැවැත්වීම.




## 05.3 විශ්වවිද්‍යාල පාලනය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2014 අංක 31 දරණ පනත මඟින් ශ්‍රී ලංකාවේ ධීවර,සාගර, සමුද්‍රීය ක්ෂේත්‍රවල මිනිස්බල අවශ්‍යතා සපුරාලීම සඳහා ධීවර,සාගර, විද්‍යාත්මක, සමුද්‍රීය තාක්ෂණය සහ සමාන ක්ෂේත්‍රවල නියැලී සිටින තැනැත්තන්ගේ විද්‍යාත්මක,තාක්ෂණික සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර දෙස් විදෙස් පිළිගත් උසස් අධ්‍යාපන හා ප්‍රායෝගික දැනුමක් ලබා දී මානව සම්පත් බිහි කිරීමේ ජාතික වගකීම ඉටු කරනු ලබන්නේය.

උපකුලපති අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රධානියා හා පරිපාලක වන අතර සම්පූර්ණ සාමාන්‍ය පරිපාලනය පිළිබඳ ලේඛකාධිකාරී වගකීමෙන් කටයුතු කරන අතර, උසස් අධ්‍යයන අංශය පීඨාධිපතිවරුන් දෙදෙනෙකු මඟින් ද, වෘත්තීය තාක්ෂණ අංශය අධ්‍යක්ෂ පුහුණු මඟින් පාලනය සිදු කෙරේ. එසේම, පාලන මණ්ඩලය, ශාස්ත්‍රීය සභාව, පීඨ මණ්ඩල, මූල්‍ය කමිටුව, ඇතුළත් කිරීම්, ප්‍රතීතන සහ තත්ත්ව සහතික කිරීමේ සභාව සහ විගණන හා කළමනාකරණ කමිටුව මඟින් මූල්‍ය හා සියලු වත්කම් කාර්යක්ෂම හා ඵලදායිකත්වයකින් පරිපාලනය කෙරේ.

සියලු පාර්ශ්වකරුවන්ගේ එනම්, සේවාලාභි ශිෂ්‍ය ප්‍රජාවගේ, අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ, සැපයුම්කරුවන්ගේ,ගනුදෙනුකරුවන්ගේ සහ ප්‍රජාවගේ අවශ්‍යතා සමතුලිත වන පරිදි විශ්වවිද්‍යාල පාලනය තීරණ ගැනීම් සිදු කර කාර්යක්ෂමව හා ඵලදායි පාලනයක් සහතික කරයි.



| නියාමනය සහ පාලනය | ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි | නිතීමය සහ නියාමන රාමුව |
|---|---|---|
| 1. අභ්‍යන්තර විගණනය<br>2. අමාත්‍යාංශ විගණනය<br>3. ජාතික විගණන කාර්යාලය මඟින් සිදු කරනු ලබන විගණනය | 1. අභ්‍යන්තර පාලන ක්‍රමවේද සහ ක්‍රියාවලි<br>2. පුරවැසි ප්‍රඥාප්තිය<br>3. අවධානම් කළමනාකරණ ක්‍රමවේද | 1. 2014 අංක 31 දරන පාර්ලිමේන්තු පනත<br>2. ආයතන සංග්‍රහය<br>3. මුදල් රෙගුලාසි<br>4. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>5. රාජ්‍ය චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීම.<br>6. පාලන මණ්ඩල තීරණ |

## අභ්‍යන්තර පාලන ව්‍යුහය

### 01. වගවීම

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේදී අනුගමනය කරනු ලබන්නේ 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය පනතේ x කොටස අංක 48, මුදල් රෙගුලාසි,රාජ්‍ය චක්‍රලේඛ, රේඛීය අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශයන්හි උපදෙස්, අයවැය දෙපාර්තමේන්තුව. මහා භාණ්ඩාගාර සහ අදාළ වන සියලු චක්‍රලේඛ සමඟ ජාතික විගණන කාර්යාලය,රේඛීය අමාත්‍යාංශ සහ විගණන අංශයන් විසින් දෙනු ලබන උපදෙස් ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය වියදම් වගවීම් සහිතව ඉටු කළ බව අවසන් ගිණුම් තුළ නිරූපණය කිරීමෙනි.

### 02. නිතීයේ ආධිපත්‍ය අනුගමනය කිරීම



## 03. පාලන රැස්වීම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2024 වර්ෂය තුළ පරිපාලනමය කටයුතු සහ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යභාරයන් පවත්වාගෙන යාම සඳහා පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව පහත දැක්වේ.

| | |
|---|---|
| පාලන මණ්ඩලය | 08 |
| ශාස්ත්‍රීය සභාව | 09 |
| ඇතුළත් කිරීම්, ප්‍රතිතන සහ තත්ත්ව සහතික කිරීම් සභාව | 02 |
| මූල්‍ය කමිටුව | 03 |
| විගණන හා කළමනාකරණ කමිටුව | 04 |
| පීඨාධිපති කමිටුව | 10 |
| වෘත්තීය තාක්ෂණ අංශය - සහකාර අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් | 09 |
| ඉංජිනේරු හා කළමනාකරණ පීඨ රැස්වීම් | 12 |
| ධීවර හා සාගර විද්‍යා පීඨ රැස්වීම් | 11 |

## 5.4 පාලන අංශ ප්‍රගතිය

**ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයීය පරිපාලන අංශය විසින් 2024 වසර තුළ පහත සඳහන් ප්‍රගතීන් සාක්ෂාත් කර ඇත.**

## පාලන අංශ උප ඒකක ප්‍රගතිය.

### 05.4.1 මානව සම්පත් සංවර්ධන අංශය

මානව සම්පත් සංවර්ධන අංශය විශ්වවිද්‍යාලයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් මානව සම්පත බඳවා ගැනීම හා සංවර්ධනය සිදු කරනු ලබයි. ඒ අනුව,සේවක අභිප්‍රේරණය සහ සුබසාධනය ප්‍රමුඛ කරගත් විනය ගරුක කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කාර්ය පද්ධති කළමනාකරණය සිදු කරනු ලැබේ.

**කාර්ය මණ්ඩල තොරතුරු 2024.12.31 දිනට.**

| සේවක | | 2024.01.01 – 2024.12.31 | | |
|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | |
| | නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව) | 15 | 14 | 29 |
| | කොන්ත්‍රාත් පදනම | 02 | 00 | 02 |
| | දරන්නාට පෞද්ගලික වනසේ | 9 | 03 | 12 |
| | අනියම් | 00 | 00 | 00 |
| | **එකතුව (1)** | **26** | **17** | **43** |
| තෘතීය මට්ටම | | | | |
| | නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව) | 03 | 01 | 04 |
| | කොන්ත්‍රාත් පදනම | 00 | 00 | 00 |
| | දරන්නාට පෞද්ගලික වනසේ | 02 | 00 | 02 |
| | අනියම් | 00 | 00 | 00 |
| | **එකතුව (2)** | **05** | **01** | **06** |
| ද්විතීය මට්ටම | | | | |
| | නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව) | 20 | 29 | 49 |
| | කොන්ත්‍රාත් පදනම | 14 | 20 | 34 |
| | දරන්නාට පෞද්ගලික වනසේ | 18 | 03 | 21 |
| | අනියම් | 00 | 00 | 00 |
| | **එකතුව** | **52** | **52** | **104** |
| ප්‍රාථමික මට්ටම | | | | |
| | නිත්‍ය (පරිවාස කාලයට යටත් නිලධාරීන් ඇතුළුව) | 53 | 06 | 59 |
| | දරන්නාට පෞද්ගලික වනසේ | 01 | 00 | 01 |
| | **එකතුව** | **54** | **06** | **60** |
| **සේවක එකතුව (1) + (2) + (3) + (4)** | | **137** | **76** | **213** |

## කාර්ය මණ්ඩල තොරතුරු

| කාර්ය මණ්ඩලය | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව | පවතින කාර්ය මණ්ඩලය | | | සත්‍ය කාර්ය මණ්ඩලය | ස්ථිර කාර්ය මණ්ඩල පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | | |
| අධ්‍යයන | U AC | 34 | 24 | 01 | 01 | 26 | 09 |
| ** පෞද්ගලික වන සේ | | 05 | 05 | 00 | 00 | 05 | 00 |
| පුස්තකාල | U AC | 03 | 00 | 00 | 00 | 00 | 03 |
| පරිපාලන හා මූල්‍ය | U EX 3 /U EX 2 | 10 | 4 | 00 | 1 | 5 | 6 |
| ** පෞද්ගලික වන සේ | U EX 3/ U EX 2 | 10 | 07 | 00 | 00 | 07 | 00 |
| අනෙකුත් විධායක | U EX 1 | 07 | 04 | 00 | 00 | 04 | 03 |
| ** පෞද්ගලික වන සේ | | 02 | 02 | 00 | 00 | 02 | 00 |
| සෞඛ්‍ය | U AS 1 | 01 | 00 | 00 | 00 | 00 | 01 |
| අධ්‍යයන සහායක | AR 1 U MN 3/ U MN 2-2 | 77 | 03 | 00 | 28 | 27 | 74 |
| ** පෞද්ගලික වන සේ | | | 15 | 00 | 00 | 15 | 00 |
| Fixed Allowance | | 12 | | | 04 | 04 | 08 |
| තාක්ෂණ නිලධාරී කළමනාකරණ සහකාර | U MT | 18 | 01 | 00 | 03 | 04 | 17 |
| කළමනාකරණ සහකාර | U MN | 59 | 48 | 00 | 00 | 48 | 11 |
| **පෞද්ගලික වනසේ | | | 06 | 00 | 01 | 07 | 00 |
| ප්‍රාථමික | U PL | 98 | 59 | 01 | 00 | 60 | 38 |

** අභියාචනා මණ්ඩල තීරණයට අනුව අන්තර්ග්‍රහණයේදී විද්‍යාල කථිකාචාර්ය තනතුරු U AC 3/ U EX 3/ U EX 1/ U MN 1 වැටුප් කේතය යටතේ දරන්නාට පෞද්ගලික වනසේ අනුමත කර ඇත.

## (ආ) අධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු

| පීඨය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය (විශ්වවිද්‍යාල/විද්‍යාල) ස්ථිර/පරිවාස | කථිකාචාර්ය (විශ්වවිද්‍යාල /විද්‍යාල | | කොන්ත්‍රාත් අධ්‍යයන කාර්ය මණ්ඩලය | උපදේශක (විද්‍යාල, සහකාර විද්‍යාල සහ අනෙකුත්) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | ස්ථිර | පරිවාස | | |
| ඉංජිනේරු හා කළමනාකරණ පීඨය | | | 02 | 09 | 06 | 03 | 04 | 00 |
| ධීවර හා සාගර විද්‍යා පීඨය | | | 11 | 03 | 03 | 00 | 01 | 01 |

(ඇ) අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු

| පීඨය/ප්‍රාදේශීය මධ්‍යස්ථානය | සේවක සංඛ්‍යාව | | | | |
|---|---|---|---|---|---|
| | ජ්‍යෙෂ්ඨ | තෘතීය | ද්විතීය | ප්‍රාථමික | කොන්ත්‍රාත් |
| ප්‍රධාන කාර්යාලය | 06 | 04 | 23 | 23 | 04 |
| ධීවර හා සාගර විද්‍යා පීඨය | 13 | 00 | 11 | 04 | 03 |
| ඉංජිනේරු හා කළමනාකරණ පීඨය | 11 | 01 | 03 | 03 | 01 |
| යාත්‍රා නඩත්තු අංශය | 00 | 01 | 04 | 00 | 01 |
| මට්ටක්කුලිය ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 02 | 00 | 00 | 02 | 05 |
| මීගමුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 01 | 00 | 04 | 05 | 03 |
| පානදුර ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 01 | 00 | 03 | 04 | 07 |
| ගාල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 02 | 00 | 04 | 04 | 01 |
| තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 03 | 00 | 10 | 09 | 03 |
| ත්‍රිකුණාමලය ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 01 | 00 | 02 | 01 | 02 |
| මඩකලපුව ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 01 | 00 | 05 | 06 | 02 |
| යාපනය ප්‍රාදේශීය මධ්‍යස්ථානය | 00 | 00 | 04 | 02 | 04 |

### 05.4.2 තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ උපාය මාර්ගයට අනුකූල වීම.

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය 2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතෙහි 14 වන වගන්තිය ප්‍රකාරව තිරසර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට සහ උපායමාර්ගයට අනුකූලව විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යයන, පුහුණු සහ පරිපාලනමය ක්‍රියාමාර්ග සැළසුම් කර ඇත.

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ විෂය පථයට අදාළව වෙන් කර හඳුනා ගන්නා ලද කාර්යයන් සහ ඉලක්කයන් එම ඉලක්ක කරා ළඟා විය යුතු දර්ශකයන්, සංධිස්ථානයන් සහ ඉලක්ක වෙත ළඟා වීම මැන බැලීම සඳහා වන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයට අදාළ දර්ශකයන් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, රේඛීය අමාත්‍යාංශය විසින් විශ්වවිද්‍යාලයට අදාළව හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හා දර්ශකයන්ට අදාළව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති/ වැඩසටහන්වලට අදාළ ප්‍රගතිය නියාමනය කරනු ලබයි.

## 05.5 අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීම සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාලයීය මූල්‍ය හා පද්ධතින් හී අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ගේ පවත්නා වැරදි හා වංචා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීමට විධිමත් අභ්‍යන්තර සෝදිසි කිරීම් සිදු කර ප්‍රගති/ අන්වේෂණය සඳහා සහාය වී සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියා කර විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා වෙත වාර්තා කිරීමේ නියෝජිතායතන කාර්යය සිදු කරනු ලැබේ.

**අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්.**

- අභ්‍යන්තර පාලන ක්‍රමයේ ක්‍රියාකාරීත්වයන් සාර්ථක දැයි සෙවීම.
- නිවැරදි මූල්‍ය ප්‍රකාශයන් සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.
- කාර්ය මණ්ඩලයේ පැවරුම් කාර්යන් ඉටුවේ දැයි සෙවීම.
- වත්කම්වල ආරක්ෂාව තහවුරු කර ඇත්තේ දැයි සෙවීම.
- නීති රීති ක්‍රියාපටිපාටි අනුගමනය කරන්නේ දැයි සෙවීම.
- නාස්තිය, දූෂණය, අනවශ්‍ය වියදම් වැළැක්වීමේ පාලන ක්‍රම පවතින්නේ ද යන්න සෙවීම.
- වත්කම් අරපිරිමැසුම් දායකව පරිහරණය කරන්නේ ද යන්න විමසීම.
- විශේෂ විමර්ශන පැවැත්වීම.
- කළමනාකරණ දෘෂ්ඨි කෝණයෙන් මෙහෙයුම් කටයුතු පිරික්සීම.
- ඉලක්ක සාධකයන් විමසීම.

දිවයිනේ අනෙකුත් විද්‍යාල සියල්ල ආවරණය වන පරිදි විගණන හා විමර්ශන රාජකාරී කටයුතු සිදු කෙරෙමින්, ආයතනයේ මූල්‍ය හා පරිපාලනය නිවැරදි මාවතක් කරා මෙහෙයවීම ද අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කෙරේ.

### 2024 වර්ෂයේ ප්‍රගතිය.

- අභ්‍යන්තර විගණන වැඩ සැලැස්ම තුළ ක්‍රියාත්මක කිරීම.
- අභ්‍යන්තර විගණන වාර්තා 10 ක් සම්පාදනය කිරීම හා එහි ප්‍රගති කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- විශේෂ විමර්ශන 04ක් පැවැත්වීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- විගණන කළමනාකරණ කමිටු 03 පවත්වා ආයතනය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගයන් සමාලෝචනය කිරීම.

**අභ්‍යන්තර විගණන විමසුම්.**



# 06. අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ තිරසර සංවර්ධනයට සහ දිගු කාලීන සාර්ථකත්වය උදෙසා අවදානම් කළමනාකරණයේ තීරණාත්මක ප්‍රභවයක් ලෙස විශ්වවිද්‍යාලයේ සියලුම ක්‍රියාවලීන්ගේ සහ පාර්ශවයන්ගේ වගකීම, වගවීම ලෙස අත්‍යවශ්‍ය කාර්යභාර්යක් සේ සළකනු ලැබේ. මේ අනුව, විශ්වවිද්‍යාලයේ අවදානම් කල් තියා හඳුනාගැනීමට, තේරුම් ගැනීමට, කළමනාකරණය කිරීමට, අවදානම අවම කිරීමට, අවදානම මාරු කිරීමට හෝ වළක්වා ගැනීමට ක්‍රියාකාරී ප්‍රවේශයක් විශ්වවිද්‍යාලයේ අවදානම් කළමනාකරණ රාමුව හරහා ඵලදායී ලෙස සිදු කළ යුතු වේ.

මෙම කාර්යයේදී සම්පූර්ණ වශයෙන් අවදානම තුරන් කළ නොහැකි වුවද, උපායමාර්ගික ක්‍රමෝපායයන් හරහා උපායමාර්ගික අරමුණු ආරක්ෂා කර ගැනීම බුද්ධිමත්ව අවදානමක් ගනිමින්, අවදානම් සඳහා අවදානම් නොගෙන ඒ වෙනුවට අවදානම පිළිබඳ දැනුවත් වීමේ ක්‍රමෝපායන් විශ්වවිද්‍යාලය විසින් ඉටු කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ සංවර්ධනය සඳහා සියලු පද්ධතීන් ආශ්‍රිතව අවදානම පිළිගත හැකි මට්ටමට කළමනාකරණය සහතික වීම සඳහා පහත සඳහන් ක්‍රමෝපායන් අනුගමනය කරනු ලැබේ.

| අවදානමේ ස්වභාවය | අවදානම් ස්වභාවය පැහැදිලි කිරීම | අවදානම ලිහිල් කිරීමේ ක්‍රියාවන් | අවදානම් හිමිකරු |
|---|---|---|---|
| **1. ව්‍යසනකාරී සිදුවීම්** | හදිසි ආපදා/ ව්‍යසනකාරී/ කඩාකප්පල්කාරී අවස්ථාවකදී විශ්වවිද්‍යාලයේ දෛනික මෙහෙයුම් කටයුතු වලට බාධාවන් සිදු වීම සහ සේවක ශරීර හානි, ජීවිත හානි සහ දේපල හානි සිදු වීම. | විශ්වවිද්‍යාලයීය ප්‍රධාන අරමුණු හඳුනාගැනීම, තීරණාත්මක කාර්යයන් සහ අංශ අතර රඳා පැවැත්ම හඳුනාගැනීම.<br><br>හඳුනාගන්නා ලද තීරණාත්මක කාර්යයන් සඳහා පිළිගත හැකි අවදානම් හඳුනාගෙන එම අවදානම් සඳහා අනාගත සැළසුම් සකස් කිරීම. | සියලුම අංශ ප්‍රධානීන් |
| **2. ව්‍යාපාරික අවදානම** | විශ්වවිද්‍යාලයීය අරමුණු සඳහා බලපෑම් කරන වර්ධනීය සාධක, තරඟකාරීත්වය සේවා ලාභීන් සඳහා ලබා දෙන සේවය අඩු වීමට හෝ නැවැත්වීමට බලපානු ලබන හේතු කාරකයන් හඳුනාගැනීම. | අවධානය යොමු කළ යුතු ප්‍රධාන තරඟකාරී ක්ෂේත්‍ර හඳුනාගැනීමට, අදාල අංශ ප්‍රධානීන් කටයුතු කර විශ්වවිද්‍යාලයීය සේවා දායකත්ව ක්‍රියාකාරකම් ඵලදායීව කළමනාකරණය කිරීම. | අධ්‍යයන අංශ ප්‍රධානීන් (පීඨාධිපතිවරුන් සහ අධ්‍යක්ෂ - පුහුණු) |
| | අවිනිශ්චිත ආර්ථික පරිසරය තුළ අරමුණු කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම්/ වැඩසටහන් කිහිපයක් මත වැඩි බරක් තබා යැපීම මත ඉලක්කගත පුහුණුලාභීන්/ ඉලක්කගත ආදායම් අත්පත් කර ගැනීමට සමස්ථ නිමැවුමට සිදුවන අහිතකර බලපෑම්. | විශ්වවිද්‍යාලයේ ප්‍රධාන අරමුණ පුහුණු මානව සම්පතක් සැපයීම වන බැවින් අධ්‍යාපනයේ සහ වෙළඳපොල ආර්ථික රටාව තුළ නැඟී එන විවිධ ප්‍රවණතා ගවේෂණය කිරීම සහ ඒ අනුව විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම. | |

| | | | |
|---|---|---|---|
| **3.** මෙහෙයුම් අවදානම | විශ්වවිද්‍යාලයීය කාර්යයසාධනය සපයනු ලබන සේවාව හා සම්බන්ධ විශ්වවිද්‍යාලයීය පද්ධතීන්ගේ සේවා සපයනු ලබන ආකාරය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්බන්ධ සියලු මෙහෙයුම් අවදානම් වලට නිරාවරණය වීමේ සේවා සැපයීමේ ගුණාත්මකභාවයේ දුර්වලතාවන් හේතුවෙන් සිසුන් පාඨමාලා හැරයාමේ වැඩිවීමක් හෝ සේවා ලාභීන්ගේ තෘප්තිමත්භාවයේ පහත වැටීමක් හඳුනාගැනීම. | ශිෂ්‍ය ප්‍රතිපෝෂණ ලබා ගැනීම සහ ඇගයීම් ක්‍රියාවලිය අඛණ්ඩව තත්ත්ව සමාලෝචනය කර සේවක කාර්යය සාධනය ඇගයීම් කාර්යය සාධනය ඉපයීම් සමඟ සම්බන්ධ කිරීම සහ කාර්යය මණ්ඩල ධාරිතා වර්ධනය කිරීම.<br><br>අර්බුද කළමනාකරණය, ආපදා යථා තත්ත්වයට පත් කිරීම නිතිපතා අභ්‍යාස සමඟ හදිසි ප්‍රතිචාර සඳහා විශ්වවිද්‍යාලය තුළ අඛණ්ඩ සැළසුම් පවත්වාගෙන යාම. | නඩත්තු සහ පරිපාලන/ මානව සම්පත්<br><br>අධ්‍යයන අංශ ප්‍රධානීන් (පීඨාධිපතිවරුන් සහ අධ්‍යක්ෂ - පුහුණු) |
| | අනපේක්ෂිත සිදුවීම් හරහා කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ ගැටළු සහ හානි සිදු විය හැකි අතර, ස්ථාවර වත්කම් හෝ උපකරණ සොරකම් කිරීම, හානි කිරීම හෝ වංචනික ලෙස වෙනස් කිරීම් සිදුවීම. | වසංගත මර්දන/ පාලන පියවරයන් පවත්වා ගැනීම.<br><br>වත්කම් භෞතික ආරක්ෂණ පාලන ක්‍රමවේද අනුගමනය කිරීම සහ වැඩි දියුණු කිරීම, CCTV කැමරා ස්ථානගත කර සාර්ථක ලෙස ක්‍රියා කරන බවට සහතික කර ගැනීම. | නඩත්තු සහ පරිපාලන/ මානව සම්පත්<br><br>අධ්‍යයන අංශ ප්‍රධානීන් (පීඨාධිපතිවරුන් සහ අධ්‍යක්ෂ - පුහුණු) |
| **4.** මූල්‍ය අවදානම | ආර්ථික/ ජීවන වියදම් අර්බුද හේතුවෙන් හටගන්නා වූ අස්ථාවරත්වයන් සහ අවිනිශ්චිතතාවන් ඉහළයාම හේතුවෙන් මූල්‍ය ක්‍රියාකාරකම් සහ හිඟ ණයගැතියන්ගේ ශේෂ කෙරෙහි බලපෑමක් ඇති වීමෙන් මුදල් ප්‍රවාහය සහ ද්‍රවශීලතා ක්ෂේත්‍ර වල සිදුවන මූල්‍ය අවදානම් සහ නිසි අනුමැතීන්ගෙන් තොරව සිදු කරනු ලබන ව්‍යාජ ගෙවීම් හරහා ඇති වන මූල්‍ය අවදානම් හඳුනාගැනීම. | ගෙවීම් කටයුතු පිළිබඳ අදාල පාර්ශ්ව වෙත නිසි පරිදි දැනුවත් කිරීම.<br><br>ලැබිය යුතු හිඟ මුදල් ආපසු අයකර ගැනීම සඳහා පසු විපරම් ක්‍රියාපටිපාටි සිදු කිරීම.<br><br>ගෙවීම් චවුචර්පත් ක්‍රමවේදයන්ට අනුකූලව සහතික කිරීම සඳහා යොමු කිරීම, මූල්‍ය සන්නිවේදනය සහ හෙළිදරවු කිරීම් වල විනිවිදභාවය සහතික කිරීම. | අධ්‍යක්ෂ - මූල්‍ය සහ පරිපාලන නිළධාරීන් |
| **5.** නියාමන අවදානම | රජයේ දැක්මට අනුකූලව නියාමන කොන්දේසි, රාජ්‍ය චක්‍රලේඛ අමාත්‍යංශ උපදෙස්, පාලන මණ්ඩල තීරණ විශ්වවිද්‍යාලයීය අවශ්‍යතා, කම්කරු නීති, සේවා ස්ථාන වල ආරක්ෂාව සහ සෞඛ්‍ය වැනි වෙනත් විවිධ නීති රීති සහ රෙගුලාසි වලට යටත්විය යුතු නමුදු, එම අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීම හේතුවෙන් දඩ මුදල් හෝ නඩු ඇතුළු වෙනත් සම්බාධක වලට යටත් වීමට සිදු විය හැක. | විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර පාලන/ සන්නිවේදන ක්‍රම ශක්තිමත් කිරීම.<br><br>විශ්වවිද්‍යාලයීය අංශයන්හි අනුකූලතා පිරික්සුම් ලැයිස්තු කාර්තුමය වශයෙන් ඇගයීම. | පරිපාලන සහ මානව සම්පත් |

# 07.විගණන හා කළමනාකරණ කමිටුව - කාර්යසාධනය 2024

විගණන හා කළමනාකරණ කමිටු සංයුතිය :-

| | නම | තනතුර | කමිටුවේ තනතුර |
|---|---|---|---|
| 01. | එච්.පී.සෝමතිලක මහතා. | අධ්‍යක්ෂ - ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව. | සභාපති |
| 02. | ආචාර්ය, කේ. ඒ. ලලිතධීර මහතා. | අධ්‍යක්ෂ ජනරාල්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව. | සමාජික |
| 03. | ඉංජිනේරු සනත් පනවෙන්නගේ මහතා. (2024 (II) වන රැස්වීම දක්වා) | අධ්‍යක්ෂ ජනරාල්, ප්‍රධාන ඉංජිනේරු,- ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය. | සමාජික |
| 04. | ඩබ්.ආර්.පී.යූ. නුවන්ති මිය. (2024 (III) වන රැස්වීම) | සහකාර අධ්‍යක්ෂ(සංවර්ධන) - උසස් අධ්‍යාපන, අධ්‍යාපන අමාත්‍යාංශය. | සමාජික |

නිරීක්ෂක ලෙස :-

| | | | |
|---|---|---|---|
| 05. | ඩබ්.ජී.ආර්.එන්. වීරක්කොඩි මිය. (2024 (I) වන රැස්වීම දක්වා) | විගණන අධිකාරි - ජාතික විගණන කාර්යාලය. | නිරීක්ෂක |
| 06. | කේ.බී.එල්.එම් කරුණාචන්ද්‍ර මිය. (2024 (II)/(III) වන රැස්වීම) | විගණන නිලධාරි. | නිරීක්ෂක |
| 07. | එම්.කේ.එන්.කේ.පී. කුමාරගේ මෙනවිය. (2024 (II)/(III) වන රැස්වීම) | විගණන නිලධාරි. | නිරීක්ෂක |
| 08. | එච්.ඩී. අනුරුද්ධිකා මිය. | ප්‍රධාන අභ්‍යන්තර විගණක - රේඛීය අමාත්‍යාංශය. | නිරීක්ෂක |

වසර තුළදී පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව - 03

| විගණන හා කළමනාකරණ කමිටු අංකය | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වූ දිනය |
|---|---|
| I වන රැස්වීම | 2024.03.28 |
| II වන රැස්වීම | 2024.07.05 |
| III වන රැස්වීම | 2024.09.11 |
| IV වන රැස්වීම | පාලන මණ්ඩල සාමාජිකයන් පත්කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2024 (IV) වන රැස්වීම පැවැත්වීමට නොහැකි විය. |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තීරණ :

**<u>I වන රැස්වීම.</u>**

| අනු අංකය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තීරණ | විශ්වවිද්‍යාලය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|---|
| 17 - 1 | ලැබිය යුතු අත්තිකාරකම් රු.මි.3.7 ශේෂයන් ඇතුළුව කපාහැරීම සඳහා නිර්දේශ කර ඇති ශේෂ කපාහැරීම සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා පාලක සභා පත්‍රිකාවක් 2024 අප්‍රේල් මස පාලන සභා රැස්වීමට ඉදිරිපත් කරනු ලබන බව අධ්‍යක්ෂ (මුදල්) විසින් කමිටුවට කරුණු දන්වන ලදි. | 84/4/FN/1 අංක දරණ පත්‍රිකාව යටතේ 84 වැනි පාලන මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමෙන් පසු, දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. ඉන්පසු උපදෙස් ලබාගෙන 85 වැනි පාලන මණ්ඩලයට කරුණු දක්වා ඇත. |

| | | |
|---|---|---|
| 17-2 | සෘද නිවාස වශයෙන් නම් කරනු ලබන ඒකක සඳහා ආර්ථික කුලිය ග්‍රාම නිලධාරි/තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් ලබා ගෙන එම අයකිරීම් විස්තර ගිණුම් අංශයට ලබා දෙන ලෙස සහකාර ලේඛකාධිකාරි (නඩත්තු) වෙත උපදෙස් ලබා දෙන ලදි. | කුලිය අයකිරීමට අදාළ වාර්තාව 86 වැනි පාලන සභාවට ඉදිරිපත් කර ඇත. අනුමැතිය ලැබීමෙන් පසු අයකිරීම කරනු ඇත. |
| | සේවයෙන් ඉවත්වන/විශ්‍රාමික යන නිලධාරින්ගේ හිඟ අයවීම් සේවක අර්ථසාධක අරමුදල් ලබා ගැනීමට අදාළ ලේඛන නිකුත් කිරීමට පෙර අයවීම් කළ යුතු බවත්. | නිශ්කාෂණ වාර්තාවක් ලබාගෙන ඒ අනුව කටයුතු කරනු ඇත. |
| 18-2 | යාත්‍රා පිළිබඳ නිර්දේශ ලබා ගැනීමට පත්කල කමිටු වාර්තාව පාලන සභාවට යොමුකර ඇති අතර ඒ අනුව එක් යාත්‍රාවක් පමණක් අළුත්වැඩියා කිරීමට නිර්දේශ කර ඇති බැවින් අනෙකුත් යාත්‍රා අපහරණය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු කිරීම. | යාත්‍රා අපහරණය කිරීමට අදාල විෂය භාර කැබිනට් අමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබාගෙන ඇත. |
| 2022 (01) | අය කිරීමට නොහැකිවී ඇති මිය ගිය සේවකයකුගේ සුනාමි ණය ශේෂය රු.55,160.00 ක මුදල කපා හැරීම සඳහා 2024 අප්‍රේල් මස පාලන මණ්ඩලයට ඉදිරිපත් කරන බවත්,මඩකලපුව විද්‍යාලයේ සේවයකළ ටී.තව්වනාමූර්ති මහතා එකතවී ඇති පරිදි රු.24,003.00 ක මුදල වාරික වශයෙන් ගෙවන ලෙස සිහිකැඳවීම් කළ බවත්,<br>අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.85,433.00ක අගය පිළිබඳව ඊළඟ කමිටුවට වාර්තා කරන බව අධ්‍යක්ෂ (මුදල්) විසින් කමිටුවට වාර්තා කරන ලදි. | මියගිය සේවකයාගේ ණය ශේෂය රු. 55,160.00 ක මුදල කපාහැරීමට කටයුතු කර ඇත. රු. 24,003.00 ක අගයෙන් රු. 10,000.00 ක් අයකර ගෙන ඇත. |
| 2022 (03) (ii) | සිසුන් බඳවාගැනීම සඳහා පවත්වනු ලබන විභාග පැවැත්වීම පිළිබඳව විභාග දෙපාර්තමේන්තුවෙන් කල් ඇතිව විමසීම් කිරීම මඟ හැරී ඇති බවත් 2023 වර්ෂයේ විමසීම් කිරීමේදී මාස 05ක කාලයක් ප්‍රමාද සිදු වී ඇති බවත්,<br><br>**<u>ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ නිරීක්ෂණ.</u>**<br>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා විභාග පැවැත්වීමට අදාළ ගෙවීම් ක්‍රමවේදය සකස් කර රේඛීය අමාත්‍යාංශ ලේකම් මඟින් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බව, | විභාග දෙපාර්තමේන්තුව විසින් විභාග පැවැත්වීමට නොහැකි බව දැන්වීම හේතුවෙන් සිසුන් බඳවාගැනීමට අදාළ කටයුතු විභාග දෙපාර්තමේන්තුවෙන් ඉටුකරවා ගැනීමට නොහැකි වී ඇත.<br><br>ගෙවීම් ක්‍රමවේදය සකස් කර භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| 2022 (02) (i) | ප්‍රමාද වී පැමිණීම් පිළිබඳ තනතුර ගැන නොසළකා අවශ්‍ය නිවාඩු ගැලපීම් සිදුකළ යුතු බවත් කාර්යයන් තත්කාලීනව සිදුකිරීම මානව සම්පත් අංශයේ කාර්යයන් බැවින් ඒ ප්‍රමාදවීම් සේවයට වාර්තා කිරීම් පිළිබඳව පාලන මණ්ඩලයට වාර්තා කිරීම. | ප්‍රමාද වී සේවයට පැමිණීම පිළිබඳව තත්කාලීනව කටයුතු සිදුකර මාසිකව ප්‍රමාදවීම් ගලපා ඊට අදාළව නිවාඩු වලින් අඩු කිරීමට කටයුතු කර ඇත. |
| 2023 (04) (iv) | මට්ටක්කුලිය ඒකකයේ ත්‍රිරෝද රථය ප්‍රවාහන සංචිතයට ගෙන ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගැනීමටත් ප්‍රමුඛතාවය මට්ටක්කුළිය ඒකකය වෙත ලබා දීම. | මෙම ත්‍රිරෝද රථය ප්‍රධාන කාර්යාලයේ සංචිතයට ගෙන ප්‍රවාහන කටයුතු සඳහා යොදාගෙන ඇත. |
| 2021 (03) | 2022 යන වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු ප්‍රාදේශීය මධ්‍යස්ථානයියල්ලහි අවසන් කර ඇති අතර ප්‍රධාන කාර්යාලයේ සමීක්ෂණ කටයුතු අවසන් කරන බවත් සහකාර ලේඛකාධිකාරි (ගබඩා) විසින් කමිටුවට වාර්තා කරන ලදි. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර ඇත. |
| 2021 (03) | ප්‍රධාන කාර්යාලයේ වාහනවලින් එක් වාහනයක් හැර අනෙකුත් වාහන සඳහා ඉන්ධන පරීක්ෂාවක් සිදුකර අවසන් කර තිබූ අතර එම සාරාංශ වාර්තාව කමිටුව වෙත එවා තිබිණි.<br>තංගල්ල පීයයේ -කාර් රථය, | ඉන්ධන පරීක්ෂාව සිදුකර ඇත. |

| | | |
|---|---|---|
| | ත්‍රිකුණාමලය - ජීප් රථය,<br>පානදුර - කාර් රථය පමණක් ඉන්ධන පරීක්ෂන සිදු කිරීමට නියමිත බව වාර්තා කර තිබිනි. | |
| **ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් 'අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ඇතුළත්ව එහි කටයුතු පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව උපකුලපති වෙත ඉදිරිපත්කරන විස්තරාත්මක විගණකාධිපති වාර්තාව.** | | |
| ආ) | පානදුර මධ්‍යස්ථානයේ කාර් රථය අපහරණය කිරීම සඳහා චක්‍රලේඛ ප්‍රකාරව කමිටුවක් පත්කිරීමටත් ඊට පසු රේඛීය අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලබා ගැනීම. | රේඛීය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවති. |

## II වන රැස්වීම.

| අනු අංකය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තීරණ | විශ්වවිද්‍යාලය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|---|
| 17-1 | අත්තිකාරම් ශේෂය වූ රු. මි. 3.7 ක ශේෂය කපාහැරීම සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කරන ලෙස පාලන සභාවේදී උපදෙස් ලබා දී තිබිණි. නමුත් රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 1/2024 හා 2/2024 මගින් එම අගයන් කපාහැරීම සඳහා පාලන සභාවට හැකියාව ඇති බැවින් ඒ සඳහා මූල්‍ය කමිටුවේ හා විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය ද ලබා දී ඇති බැවින් නැවතත් පාලන සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා පාලන සභාවට ඉදිරිපත් කිරීම. | මෙම අගය කපාහැරීම සඳහා පාලන සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාදී තිබුණද එම අනුමැතිය ස්ථිර කිරීම සඳහා ඊලඟ පාලන සභාවට ඉදිරිපත් කළද එම රැස්වීමේදී නැවත විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස තීරණය කර ඇත. |
| 17-2 | 01) මෙම නිවාස භාවිතයට ගත හැකි තත්ත්වයේ නොපැවතීම එම ගොඩනැගිලි දීර්ඝකාලීනව අළුත්වැඩියා සිදු කර නොතිබීම මෙම ගොඩනැගිලි ආයතන සංග්‍රහයේ දක්වා ඇති පරිදි වෙන්කර දී නොමැති බවටත් කරුණු දන්වන ලදි.<br>02) එමෙන්ම මෙම විශ්වවිද්‍යාලය දීප ව්‍යාප්තව පැවතිමෙන් රාජකාරි සඳහා සහභාගීවන අයවලුන් සහ හදිසි අවස්ථාවලදී රාජකාරි යෙදීමේදී නවාතැන් පහසුකම් ලබාගැනීමට ගොඩනැගිලි වෙන්කර නොමැති බවටත් කරුණු දන්වන ලදි<br>03) නිවාස පිළිබඳව වාර්තාවක් ලබාගැනීම සඳහා මේ වන විට කමිටුවක් පත්කර ඇති බවත් එම වාර්තාව ලබාගෙන පාලන සභාවට ඉදිරිපත් කිරීමටත්<br>04) රියදුරු හා පිරිසිදු කිරීම් කාර්ය සඳහා නිරතවන කම්කරුවන් සඳහා නේවාසිකාගාර කුලි වලින් නිදහස් කිරීමටත් සුදුසු බවත් රේඛීය අමාත්‍යාංශයේ රියදුරන් සඳහා අයකිරීම් නොකරන බවට කරුණු දැක්විණි.<br>05) අනෙකුත් නිලධාරන් සඳහා අයකිරීම් 2024 අගොස්තු මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අයකිරීම් සිදු කිරීමට හැකිවන පරිදි අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස සහකාර ලේඛකාධිකාරි (නඩත්තු) වෙත කමිටුව උපදෙස් ලබා දෙන ලදි.<br>06) එසේම ප්‍රාදේශීය මධ්‍යස්ථාන /පීඨ සිට ප්‍රධාන කාර්යාලයේ රාජකාරි සඳහා පැමිණෙන නිලධාරින් සඳහා හදිසි අවස්ථාවලදී නවාතැන් ගැනීමට සුදුසු පරිශ්‍රයක් වෙන්කිරීමට උපදෙස් ලබා දෙන ලදි. | රියදුරු හා පිරිසිදු කිරීම් කාර්ය සඳහා නිරතවන කම්කරුවන් සඳහා නේවාසිකාගාර කුලි වලින් නිදහස් කිරීමටත් අනෙකුත් නේවාසිකයිනගෙන් අයවීම් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අගයන් ලබාගෙන 2024 අගෝස්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි හිඟ මුදල් සමග අයකරන ලෙස සහකාර ලේඛකාධිකාරි (ගබඩා) වෙත උපදෙස් ලබාදී ඇත. |
| 18-2 | පුහුණු යාත්‍රා 04 ක් අපහරණය කිරීම සඳහා අනුමැතිය ලබා ඇති බැවින් ඒ සඳහා ප්‍රත්‍යාගනන වටිනාකම් හා ඉදිරි කටයුතු සඳහා නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ ලැබුණු පසු ඉදිරි කටයුතු සිදුකරන බව අධ්‍යක්ෂ (මුදල්) විසින් කරුණු දන්වන ලදි. | අපහරණය කිරීමට තීරණය කර ඇති යාත්‍රා 04 ක් ප්‍රාදේශීය මධ්‍යස්ථානවලට ගෙන ඒමට කටයුතු කරමින් පවති. |

| | | |
|---|---|---|
| 2022 (01) | ලැබිය යුතු සුනාමි ණය ශේෂය වූ රු.24,003.00 ක අගය ගෙවීම් කරන ලෙස සිහිකැඳවීම් 03 ක් යවා තිබුණද ගෙවීමට කටයුතු කර නොමැති බැවින් ඒ පිළිබඳව නීති කටයුතු සිදුකරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | රු. 10,000.00 ක මුදලක් ගෙවා ඇත. ඉතිරි රු. 14,003.00 මුදල අයවීමට ඇත. |
| 2022 (03) (ii) | සිසුන් බඳවා ගැනීමට අදාළව විභාග පැවැත්වීම වෙනුවෙන් කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් ක්‍රමවේදය හා රේටයන් සඳහා පාලන සභාවේ අනුමැතිය ලබා ගෙන තිබුණද ඒ සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ලෙස රේඛීය අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලබාගැනීම සුදුසු බව විගණන නිලධාරිගේ නිරීක්ෂණය බැවින් ඒ අනුව කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් ලබා දෙන ලදි. | ගෙවීම් ක්‍රමවේදයක් සකස් කර පාලන සභාවේ අනුමැතිය ලබාගෙන රේඛීය අමාත්‍යාංශය මගින් අනුමැතිය සඳහා යවා ඇත. |
| 2022 (02) (i) | 01) ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලින් 04 කම ඇඟිලි සළකුණු යන්ත්‍ර අක්‍රිය වී ඇති බවත් එම යන්ත්‍ර නිතර නිතර අක්‍රිය වන බැවින් එම යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, සේවා ගිවිසුම් ගාස්තු ගෙවීම වැනි අතිරේක පිරිවැයක් දැරීමට සිදුවේ.<br>02) එම නිසා මුහුණු මඟින් සේවයට වාර්තා කිරීමට හැකිවන පරිදි මේවන විට TVEC, RDA වැනි ආයතන ද මිලදී ගෙන ඇති උපකරණ පිළිබඳව අවධානය යොමු කර පිරිවැය හා EMIS පද්ධතියට සම්බන්ධ කළ හැකිවන පරිදි සුදුසු උපකරණ පිළිබඳ නිර්දේශ ලබාගෙන එම උපකරණ සියළුම ප්‍රාදේශීය මධ්‍යස්ථාන/ පීඨය සඳහාද සවිකිරීමටත් ඒ සඳහා පාලන සභාවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් එම අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස කමිටුව උපදෙස් ලබා දෙන ලදි. | උපකරණ මිලදී ගැනීම සඳහා පාලන සභාවේ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කරමින් පවතී. |
| 2021 (03) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු නොපැවැත්වීම පිළිබඳව කමිටු සභාපති විසින් දැඩිව අවධානයට ලක්කළ අතර එහිදී භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලදී වැඩහල් පුහුණු උපකරණ, දැල්, වැඩහල් ආදිය සමීක්ෂණයට ලක්කළ යුතු බැවින් ඒ සඳහා කරනු ලබන කාර්යභාරය හා කැපකිරීම් පිළිබඳව කමිටුවේ අවධානය යොමු කළ අතර ඒ සඳහා මීට පෙර 2017 වර්ෂයේ ද පාලන සභාව විසින් අමතර දීමනාවක් ගෙවීමට අනුමැතිය ලබා තිබූ බැවින් ඒ සඳහා දීමනාවක් ගෙවීම සඳහා පාලන සභාවේ අනුමැතිය ලබා ගැනීමට නිර්දේශ විය. | මෙම දීමනා ගෙවීම සඳහා පාලන මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. |
| 2023 (02) (ii) | මෙම මෘදුකාංගය යටතේ දැනට ස්ථාපිත කිරීමට ඇති පුස්තකාල මොඩියුලය සඳහා දත්ත ඇතුළත් කිරීමට කටයුතු 2024.07.10 දින වන විට අවසන් කිරීමට හැකිවන බවත් උපදේශක (තොරතුරු තාක්ෂණ) විසින් කමිටුවට කරුණු දන්වන ලදි.<br>රු. මි. 9.7 ක් ඉහල අගයක් ගෙවා මිලදී ගෙන ඇති මෙම මෘදුකාංගය භාවිතා කිරීම සඳහා උපදේශක (තොරතුරු තාක්ෂණ) වරයෙකු බඳවාගෙන ඇති බැවින් ඒ මහතාගේ සේවය ලබාගෙන මෙම පද්ධතිය ක්‍රියාත්මක කර පවත්වාගෙන නොයාම පිළිබඳව විගණන විමසුම් හා පොදු ව්‍යාපාර කාරක සභාවේ නිරීක්ෂණයට ලක්විය හැකි බව සහකාර අභ්‍යන්තර විගණක විසින් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදි. | මෘදුකාංගය මිලදී ගෙන ඇති ආයතනය සමග සම්බන්ධව ක්‍රියාත්මක කරමින් පවතී. පුස්තකාල මොඩියුලය ක්‍රියාත්මක කර නොමැත. |
| 2023 (03) (i) | ප්‍රධාන කාර්යාලයේ විදුලි බිල්පත් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය නමින් ලබාගෙන ඇති බවත් ජල බිල්පත් සඳහා අවශ්‍ය ලේඛණ භාරදී ඇති බවත් 2024 අගෝස්තු මස සිට ජල බිල්පත් විශ්වවිද්‍යාලයේ නමින් ලබා ගැනීමට හැකිවන බවත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන වලටද එම බිල්පත් විශ්වවිද්‍යාලය නමින් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ලිඛිත උපදෙස් ලබා දී ඇති බවත් සහකාර ලේඛකාධිකාරි (නඩත්තු) විසින් කරුණු දැක්විනි. | කාර්යය ඉටු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| 2023 (03) (iv) | මීගමුව සහකාර අධ්‍යක්ෂ නිල නිවස/ නේවාසිකාගාර සඳහා නල ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා අවශ්‍ය දැන්වීම් කර ඇති අතර එම ජල සම්බන්ධතා ලබා ගැනීමට කටයුතු ඊළඟ රැස්වීම් වාරයට පෙර අවසන් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදි. | මීගමුව සහකාර අධ්‍යක්ෂ නිල නිවස සඳහා ජල මීටර සවිකර ජසම්බන්ධතාවය ලබාගන ඇත.<br>නේවාසිකාගාර සඳහා නල ජල සම්බන්ධතාවය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. |
| 2023 (04) (v) | බැංකු ගිණුම් දෙකකට අදාළව බැංකු සැසඳුම් 2024 මැයි මස දක්වා සකස් කර අවසන් බවත් එක් බැංකු ගිණුමකට අදාල බැංකු සැසඳුම් සකස් කිරීමට නියමිත බවත් හැකි ඉක්මණින් බැංකු සැසඳුම් සකස් කර අවසන් කරන බව අධ්‍යක්ෂ (මුදල්) කමිටුවට කරුණු දැක්විනි අවශ්‍ය වන්නේ නම් විගණන නිලධාරින් සඳහා පරීක්ෂා කර බැලිය හැකි බවට කරුණු දක්වා ඇත. | කාරණය පිළිබඳව අධ්‍යක්ෂ (මුදල්)ගේ අවධානය යොමුකර ඇත. |
| අ) | පානදුර මධ්‍යස්ථානයේ කාර් රථය අපහරණය කිරීම සඳහා චක්‍රලේඛ ප්‍රකාරව කමිටුවක් පත්කිරීමටත් කටයුතු කර ඇති බවත් එම නිර්දේශ ලැබුණු පසු ඊට රේඛීය අමාත්‍යංශ ලේකම් ගේ අනුමැතිය ලබා ගැනීම. | අමාත්‍යංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා<br>ගැනීමට කටයුතු කරමින් පවතී. |
| 2024 (i) | මෙම පාඨමාලාව සඳහා FCAW පාඨමාලව සඳහා පැය 72 කින් මෙවැනි සහතික පත්‍රයක් ලබාදිය නොහැකි බවත් එසේ සිදුකිරීමෙන් ඒ සඳහා පිළිගැනීම අවම වන බවත් ඒ බව මෙම පාඨමාලවට අදාළ ගෙවීම් අනුමත කරන අවස්ථාවේදී මෙම පාඨමාලාව සඳහා ප්‍රතීතනයක් ලබාගන්නා ලෙස අධ්‍යක්ෂ (පුහුණු) වෙත පාලන සභාවේදී උපදෙස් ලබා දුන් බවත් ඒ සඳහා NVQ සහතික පත්‍ර ලබාගෙන නොතිබීම කමිටුවේ අවධානය යොමුකළ අතර මෙම පාඨමාලාව සඳහා තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි නොකර පාඨමාලාවක් පවත්වාගෙන නොයන ලෙසත් එසේ කිරීම තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පනත උල්ලංඝනය කිරීමක් බව එසේ කිරීම බරපතල වරද්දක් බව කමිටු සාමාජික හා තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කමිටුවට අවධාරණය කරන ලදි. | FCAW පාඨමාලව ප්‍රතීතනය කර ඇත. |
| | 2020/1 PED චක්‍රලේඛය අනුව මෙම පාඨමාලාව සඳහා ගෙවීම් ක්‍රමවේදය සකස් කර ඇති බවත් ඒ සඳහා පාලන සභාවේ අනුමැතිය ලබා ගෙන අමාත්‍යංශයේ අනුමැතිය ලබා ගැනීම සිදුකරන ලෙස කමිටුව උපදෙස් ලබා දෙන ලදි. | රේඛීය අමාත්‍යංශය මගින් භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා යොමු කර ඇත. |
| | <u>විගණන නිලධාරිගේ අදහස් දැක්වීම.</u><br>නිල නිවස කුලි අයකිරීම සුදුසු බවත් ආර්ථික කුලිය තක්සේරු කර එම අගය අයකිරීම සුදුසු බවත් රජයේ දේපලක් භාවිතා කරන බැවින් එම නිවාස විධිමත්ව භාරදීමට කටයුතු කල යුතු බවත් නිරීක්ෂණය ඉදිරිපත් කරන ලදි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු අගය ලබාගැනීමට කටයුතු කර එම අගයන් 2024අගොස්තු මස සිට හිඟ මුදල් සමඟ අයකරමින් පවතී. |

<u>III වන රැස්වීම.</u>

| අනු අංකය | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තීරණ | විශ්වවිද්‍යාලය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග |
|---|---|---|
| 17-1 | අත්තිකාරම් ශේෂය වූ රු. මිලියන 3.7 ක අගය කපාහැරීම පිළිබඳව රේඛීය අමාත්‍යංශ විගණන හා කළමනාකරණ කමිටුවේදී ද කරුණු ඉදිරිපත් කළ අතර එම අගයන් කපාහැරීම සඳහා පාලන සභාවට බලය ඇති බවත් මේවන විට ක්‍රමවේදය අනුගමනය කර තිබෙන නිසා ඊළඟ පාලන | 84/4/FN/1 අංක යටතේ 84 වැනි පාලන මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමෙන් පසු, දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. ඉන්පසු උපදෙස් අනුව 85 |

| | | |
|---|---|---|
| | සභාවට ඉදිරිපත් කර කපාහැරීම සඳහා අනුමැතිය ලබාගැනීමට කටයුතු කර ඇත. | වැනි පාලන මණ්ඩලයට කරුණු දක්වා මෙම අගය කපාහැරීමට අනුමැතිය ලබාදී තිබිණි. එම අනුමැතිය ලද සටහන් පත්‍රිකාව ස්ථිර කිරීම සඳහා 86 වැනි පාලන මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී.එම පාලන මණ්ඩය නව රජයේ පත්වීමෙන් පසු නව පාලන මණ්ඩලයක් පත්ව ඇති බැවින් නැවත පාලන මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. |
| 17-2 | නේවාසිකාගාර පිළිබඳව නිර්දේශ ලබාගැනීම සඳහා පීඨාධිපතිගේ සභාපතිත්වයෙන් කමිටුවක් පත්කර ඇති අතර ඒ සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වටිනාකම් ලැබූ පසු එම අගයන් අයකර ගැනීමට හැකිවන පරිදි ඊළඟ පාලන සභාවට කමිටු වාර්තාව ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන අයකිරීම් සිදුකිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු අගයන් ලැබී ඇත. ඒ අනුව සකස් කරන ලද කමිටු වාර්තාව සකස් කර ඇත. 86 වැනි පාලන සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන අයකිරීම් සිදුකරනු ලබයි. |
| 18-2 | පුහුණු යාත්‍රා අපහරණය කිරීම සඳහා විෂය භාර ඇමතිතුමාගේ ද අනුමැති ලැබී ඇති අතර එම යාත්‍රා 04 අපහරණය කිරීමේ ක්‍රමය හා තක්සේරු වටිනාකම පිළිබඳව නිර්දේශ ලබාගැනීම සඳහා කමිටුවක් ඇති අතර එම කමිටුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මේ වන විට නිලධාරියකු නම්කර ඇති බවත්,<br>එම යාත්‍රා පරීක්ෂා කිරීම සඳහා 2024.09.12 වන දින එම පරිශ්‍රයන් වෙත යැමට නියමිත බවත් අධ්‍යක්ෂ (මුදල්) විසින් කරුණු දන්වූ අතර ඉන්පසු එම වාර්තාව ඊළඟ පාලන සභාවට ඉදිරිපත් කර අපහරණ කටයුතු ඉක්මනින් අවසන් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | කමිටු වාර්තාව සකස්කර ඇති අතර අපහරණය කිරීමට තීරණය කර ඇති යාත්‍රා වල එන්ජින් පුහුණු කටයුතු සඳහා ලබාගැනීමටත් හල්එක ප්‍රදර්ශන කටයුත්තක් සඳහා ප්‍රාදේශීය විද්‍යාල භූමියට රැගෙන ඒමටත් කටයුතු කරමින් පවතී. |
| 2022 (01) | මේවන විට අයවියයුතු සුණාමි ණය ශේෂයෙන් රු. 10,000.00 ක මුදලක් ගෙවා ඇති බවත් ඉතිරි මුදල් වූ රු.14,003.00 ක් පමණක් අයකිරීම් නියමිත බවට අධ්‍යක්ෂ (මුදල්) විසින් කමිටුවට ප්‍රකාශ කරන ලදී. | රු. 14,003.00 ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරනු ඇත. |
| 2022 (03) (ii) | සිසුන් බඳවාගැනීම සඳහා පවත්වනු ලබන විභාග සඳහා කාර්ය මණ්ඩලය සඳහා ගෙවීම් කිරීම ක්‍රමවේදය පාලන සභාවේ අනුමැතිය ලබාගෙන තිබුණද ඒ සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව මහාභාණ්ඩාගාරයේ (රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව) අනුමැතිය ලබාගත යුතු බවත් ඒ සඳහා ජේ්‍යෂ්ඨ අමාත්‍යංශ ලේකම් මඟින් මහාභාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කරන ලෙසත්, | මේ සඳහා ගෙවීම් සඳහා සකස් කරන ලද ගෙවීම් රේටයන් සංශෝධනය කර පාලන සභාවට ඉදිරිපත් කිරීමට නියමිත අතර එම අනුමැතිය ලැබීමෙන් පසු රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කරනු ඇත. |
| 2022 (02) (i) | නව උපකරණ මිලදීගැනීම සඳහා පසුගිය රැස්වීමේදී තීරණය පරිදි 84 වැනි පාලන සභාව සඳහා පාලන සභා පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන ඇති බවත් ඒ සඳහා මුහුණ හා ඇඟිලි සලකුණු යන ක්‍රමදෙකම මඟින් සේවයට වාර්තා කළ හැකි උපකරණ මේවන විට TVEC ආයතන මඟින් මිලදී ගෙන ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බවත් ඒ සඳහා එම ආයතනයන් පිරිවිතර ලබාගෙන එම උපකරණ විශ්වවිද්‍යාලයේ සියළුම ප්‍රාදේශීය මධ්‍යස්ථාන/ පීඨවලට ස්ථාපිත කර ඊට අදාළ ප්‍රගතිය ඊළඟ කමිටුවට ඉදිරිපත් කරන ලෙස කරුණු දැක්විණි. | ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය මධ්‍යස්ථාන 07 ක් හා පීඨවල භාවිතය සඳහා නව ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගෙන ඇත .<br>2025.01.20 අවසන් වන විට එම කටයුතු ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. |
| 2021 (03) | 2022 වර්ෂයේ පසුභාර කටයුතු ඉක්මණින් අවසන් කරන ලෙසත් 2023 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතුද ආරම්භ කර චක්‍රලේඛ ප්‍රකාරව එම කටයුතු අවසන් කරන ලෙස උපදෙස් දෙන ලදී. | 2022 වර්ෂයේ පසුභාර කටයුතු අවසන් කර නොමැත. 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොමැති නිසා 2023 හා 2024 වර්ෂ දෙක සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු චක්‍රලේඛය අනුව ආරම්භ කරන ලෙස |

| | | |
|---|---|---|
| | | සහකාර ලේඛකාධිකාරි (ගබඩා) වෙත උපදෙස් ලබා දී ඇත. |
| 2023 (02) (ii) | රු. මි.9.7 ක් ගෙවා මිලදී ගැන ඇති EMISමෘදුකාංගය ක්‍රියාත්මක කිරීමට අදාළ කාර්ය ඉටුකිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටින නිලධාරියා ආයතනයේ ප්‍රස්තුත කාර්ය සඳහා පමණක් යොදවා ගන්නා ලෙසත් එම නිලධාරියා විශ්වවිද්‍යාලයේ ස්ථිර නිලධාරියකු යටතට පත්කර ඔහුගේ අධීක්ෂණය යටතේ මෙම කාර්ය ඉටුකර ගන්නා ලෙසත් කමිටුව උපදෙස් ලබාදෙන ලදි. | මෙම කාර්යය ඉටුකරවා ගැනීම සඳහා බඳවාගත් නිලධාරිවරයා විභාග අංශයේ රාජකාරි සඳහා යොදවා ඇති අතර එම නිලධාරියා ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි (විභාග) අධීක්ෂණය යටතේ සේවයේ යොදවා ඇත. |
| | මෘදුකාංගය ක්‍රියාත්මක කිරීම සඳහා එක් එක් අංශය සඳහා නිලධාරියකු බැගින්ද අංශ ප්‍රධානියාද තොරතුරු තාක්ෂණ නිලධාරියා ද ඇතුළත් වන පරිදි උපකුලපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වීම් පවත්වා මෙම කාරණය ඉටුකර ඊළඟ කමිටුවට ප්‍රගතිය වාර්තා කරන ලෙස කමිටුව විසින් උපදෙස් ලබාදෙන ලදි. | උපකුලපතිතුමා හා අදාළ ආයතනය රැස්වීමක් පවත්වා ඇති අතර අදාළ ආයතනය සමඟ සම්බන්ධීකරණය කරමින් කටයුතු සිදුකරනු ලබයි. |
| | මෙම මෘදුකාංගයට අයත් පුස්තකාල මොඩියුලය සඳහා දත්ත ඇතුළත් කිරීමේ කටයුතු සේවා ආයතනය විසින් සිදුකරමින් පවතින බවත් එම කටයුතු අවසන්කර නොමැති බවත් පුස්තකාලය භාර නිලධාරිණිය කරුණු දක්වන ලදී. | කාර්යය මේවන විට අවසන් කර නොමැති අතර සේවා ආයතනය සමඟ ඉටුකරමින් පවතී. |
| | ස්ථාවර වත්කම් ලේඛනයද මෙම මෘදුකාංගය හා සම්බන්ධකර ඒ සඳහා දත්ත ඇතුලත් කරන ලෙසත් එම කටයුතු 2022 වර්ෂයේ සිට ආරම්භ කරන ලෙස උපදෙස් ලබා දී තිබුණද මේවනතෙක් එම කාර්ය ඉටු නොවීම පිළිබඳව රේඛීය අමාත්‍යංශ ප්‍රධාන අභයන්තර විගණකගේ අවධානයට ලක් කරන ලදී. | කාර්යය ඉටුකිරීම සඳහා අවශ්‍ය තොරතුරු පද්ධතිය ස්ථාපිත කළ ආයතනය වෙත ලබාදී ඇත. |
| | එම නිසා පසුගිය වර්ෂවල වත්කම් ඇතුලත්කරන තෙක් 2024 වර්ෂයේ මිලදී ගෙන ඇති උපකරණ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර එතැන් සිට යාවත්කාලීන කරගෙන එන ලෙස අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් ලබාදෙන ලදි. | 2024 වර්ෂයේ ඇතුළත් කරමින් පවතී. |
| 2023 (03) (i) | ප්‍රධාන කාර්යාලයේ විදුලි බිල්පත් ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය නමින් ලබාගෙන ඇති බවත් ජල බිල්පත් සඳහා අවශ්‍ය ලේඛන භාරදී ඇති බවත් 2024 අගෝස්තු මස සිට ජල බිල්පත් විශ්වවිද්‍යාලයේ නමින් ලබා ගැනීමට හැකිවන බවත් ප්‍රාදේශීය මධ්‍යස්ථානවලටද එම බිල්පත් විශ්වවිද්‍යාලය නමින් ලබා ගැනීමට කටයුතු කරන ලෙස ලිඛිත උපදෙස් ලබා දී ඇති බවත් සහකාර ලේඛකාධිකාරි (නඩත්තු) විසින් කරුණු දැක්විණි | කාරණයට අදාළ මූලික කටයුතු ආරම්භ කර ඇත. |
| 2023 (03) (iv) | (i) ප්‍රධාන කාර්යාලයේ නේවාසිකාගාරවල ද මෙවන විට කාර්යාලීය නලජල මනුව මඟින් ජලය ලබාගන්නා බැවින් ඒ සඳහා වෙනමම ජල මනු සවි කිරීම සිදුකල යුතුබවත් ඒ සඳහා ද අවශ්‍ය කටයුතු කිරීම. | ප්‍රධාන කාර්යාලයේ නේවාසිකාගාර සඳහා ජල මනු සවි කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත. |
| 2023 (04) (v) | බැංකු සැසඳුම් සකස් කිරීම ජංගම ගිණුම් දෙකක 2024 ජුනි දක්වා සකස් කර අවසන් බවත් අනෙක් ගිණුමේ මැයි දක්වා සකස් කර අවසන් කර ඇති බවත්,<br>පසුගිය වර්ෂයේ ඇති වූ ප්‍රමාදයන් බවත් කාර්ය මණ්ඩලයේ හිඟතාවය ප්‍රමාදයට හේතු වී ඇති බවත් අධ්‍යක්ෂ (මුදල්) කමිටුවට වාර්තා කරන ලදි. | විශ්වවිද්‍යාලයේ සියළුම ජංගම ගිණුම්වල බැංකු සැසඳුම් සකස් කිරීම තත්කාලීනව පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් ලබා දි ඇත. |
| | විශ්වවිද්‍යාලයේ මේ සඳහා ගිණුම් අංශයේ අනුමත තනතුරක් වන සහකාර අධ්‍යක්ෂ (මුදල්) තනතුරේ සේවය කරනු ලබන නිලධාරිණියගේ සේවය ගිණුම් අංශයට ලබා | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල තුළ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇත.විශ්වවිද්‍යාල වාර්ෂික |

| | | |
|---|---|---|
| | නොගැනීම පිළිබඳව මීට පෙරද කමිටුව කරුණු ඉදිරිපත් කර තිබුණද මේවන විටත් එම කාර්ය ඉටුනොවීම පිළිබඳව ජේ්ඛීය අමාත්‍යංශ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ නිරීක්ෂණයට ලක්කරන ලදි. එම කරුණ අවසන් විගණන වාර්තාවලද දක්වා ඇති බවට කරුණු දැක්විණි. | වාර්තා සකස් කිරීම, සංයුක්ත සැලසුම් සකස් කිරීම හා වාර්ෂික සැලසුම් සකසා ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රගතීන් අමාත්‍යංශයට/ අදාළ ආයතනවලට යොමුකිරීම් සම්බන්ධීකරණ කටයුතු කාර්යය මෙම නිලධාරිණියට පවරා ඇත. |
| | විශ්වවිද්‍යාලයේ ගිණුම් අංශය,වෘත්තීය පුහුණු අංශය හා විභාග අංශය සඳහා කළමනාකරණ සහකාර හිඟය එම අංශවලට දෛනික කාර්යයන් ඉටු කිරීමට නොහැකිවීම පිළිබඳව කමිටුවේ අවධානය යොමුකළ අතර ඒ සඳහා දැනට පුරප්පාඩු පවතින කළමණාකරණ සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමට අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරන ලෙස කමිටුව සහකාර ලේඛකාධිකාරි (මානව සම්පත්) වෙත උපදෙස් ලබා දෙන ලදි. | මේවන විට අනුමැතිය ලැබී ඇති තනතුරු 60ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී<br>. |
| අ) | පානදුර මධ්‍යස්ථානයේ අපහරණය කිරීමට නිර්දේශ කර ඇති කාර් රථය අපහරණය කිරීම සඳහා මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවෙන් හෝ වෘත්තීය පුහුණු ආයතනයක නිලධාරියකු නම් කරවාගෙන මෙම කමිටු වාර්තාව ලබාගෙන ඉදිරි කටයුතු කිරීම සුදුසු බවට කමිටුව නිර්දේශ කරන ලදි.<br>මෙවැනි රාජ්‍ය සම්පත් විනාශ වීමට ඉඩ හැරීම ආයතන සංග්‍රහයේ වගන්තීන්ට අනුව වරදක් බව විගණන නිලධාරින් නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදි. | මෝටර් රථ වාහන දෙපාර්තමේන්තුවෙන් නිලධාරියකු නම්කර එවා ඇති අතර කඩිනමින් එම කාර්යය අවසන් කරන ලෙස උපදෙස් දී ඇත. |
| 2024 (i) | මෙම පාඨමාලාව ද ඇතුලත්වන පරිදි ස්වයං ආදායම් ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් ක්‍රමවේදය සකස් කර පාලන සභාවේ අනුමැතිය ලබා ගෙන තිබුණද අමාත්‍යංශ ලේකම් මඟින් මහාභාණ්ඩාගාරය වෙතින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස කමිටුව අධ්‍යක්ෂ (මුදල්) වෙත උපදෙස් ලබා දෙන ලදි. | එළඹෙන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කරනු ඇත. |
| 2024 (iii) | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා ලෝගු මිලදී ගැනීම පිළිබඳව විගණන විමසුම පිළිබඳව ජේ්ඛීය අමාත්‍යංශ විගණන හා කළමනාකරණ කමිටුවේ උපදෙස් පරිදි කමිටුවක් පත්කර වාර්තාවක් ඉදිරිපත්කරන ලෙස තීරණය කර තිබූ අතර එම කමිටුව සඳහා ජේ්ඛීය අමාත්‍යංශ නියෝජිතයකු නම්කර එවන ලෙස ලිපියක් යවා ඇති අතර එම නියෝජිත නම්කර එවූ පසු එම කමිටුව පත්කර වාර්තාව ඉදිරිපත් කරන බවට සහකාර අභ්‍යන්තර විගණක විසින් කමිටුවට වාර්තා කරන ලදි. | මෙම කාර්යය පිළිබඳව කමිටු වාර්තාව ලබාගෙන ඇති අතර එම වාර්තාව 86 වැනි පාලන සභාවට ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| 2024 (03) (i) | ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ මඩකලපුව සංචාරක බංගලාව පිළිබඳව විගණන වාර්තාව මඟින් නිර්දේශ කර ඇති කරුණු අනුව සංචාරක බංගලාවේ වෙන්කිරීමේ කටයුතු විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය මඟින් පමණක් සිදුකළ යුත්තක් බැවින් වෙන්කිරීම් කරනු ලබන ලේඛන පවත්වාගෙන යෑම, මුදල් අයකිරීම් ඊට අදාල ලේඛන, ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය මඟින් සිදුකිරීමට අදාළ රාජකාරි විධිමත්ව පාලන අංශය වෙත පැවරීම. | කාර්යය පිළිබඳව අවධානය යොමුකර සංචාරක බංගලාවේ වෙන්කිරීමේ කටයුතු විශ්වවිද්‍යාලයේ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය මඟින් පමණක් සිදුකරනු ලබයි.<br>ලේඛන පවත්වාගෙන යෑම, මුදල් අයකිරීම් ඊට අදාල ලේඛන, ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය මඟින් සිදුකරනු ලැබේ. |
| 2024 (03) (ii) | මඩකලපුව සංචාරක බංගලාවේ තොරතුරු වෙබ් අඩවියේ පලකිරීම. හා වෙන්කිරීමේ හැකියාව විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය මඟින් පරික්ෂා කිරීම ඇති හැකියාව පිළිබඳ අවධානය යොමු කිරීම. | කාරණය පිළිබඳව ඉදිරියේදී ක්‍රියාකරනු ඇත. |
| 2024 (03) (iii) | විගණන වාර්තාව මඟින් වාර්ත කර ඇති මෙම භාහිර උපදේශකවරිය මේවන විටත් සේවයේ නිරතවන බැවින් එම නිලධාරිණිය නවාතැන් ගෙන තිබූ දිනයන් සඳහා පාලන සභාව විසින් අනුමත කර ඇති කාමර ගාස්තු අයකිරීම් සිදුකර ඊලඟ රැස්වීම සඳහා වාර්තා කිරීමටත් එසේ එම නිලධාරිණියගෙන් අයකර ගැනීමට නොහැකිනම් අනුමැතිය ලබාදී ඇති නිලධාරියාගෙන් එම අගය අයකිරීමට කටයුතු කිරීම. | අයකිරීම් සඳහා 86 වැනි පාලන සභාවට පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර එම අනුමැතිය ලද පසු අයකිරීම් සිදුකරනු ඇත. |
| 2024 (03) (iv) | සංචාරක බංගලාව පිළිබඳව අභ්‍යන්තර විගණන වාර්තාව මඟින් පෙන්වා ඇති කරුණු පිළිබඳව හා මෙම සංචාරක බංගලාව පවත්වාගෙන යෑම පිළිබඳව රේඛීය අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කළ අතර ඒ සඳහා කමිටුවක් පත්කර එම වාර්තාව පාලන සභාවට ඉදිරිපත් කර ඒ අනුව කටයුතු කරන ලෙස රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමිය විසින් උපදෙස් ලබා දී ඇති බැවින් එම උපදෙස් අනුව කටයුතු කිරීම. | මේ සඳහා කමිටුවක් පත්කර කමිටු වාර්තාව ලබාගෙන ඇති අතර එම වාර්තා 86 වැනි පාලන මණ්ඩල මණ්ඩලට ඉදිරිපත් කර ඇත. |
| 2024 (03) (v) | I. සහකාර විද්‍යාල උපදේශක තනතුර සඳහා බඳවාගැනීම සඳහා බඳවාගැනීම් පරිපාටින් සකස් කර රේඛීය අමාත්‍යාංශ මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.<br>II. අධ්‍යක්ෂ (පුහුණු) තනතුර, උපදේශක තනතුරු 14ක් සඳහා බඳවාගැනීමට පුවත්පත් දැන්වීම් පලකර ඇති බවත් සහකාර ලේඛකාධිකාරි (මානව සම්පත්) විසින් කරුණු දැක්විණි. | I. සහකාර විද්‍යාල උපදේශක තනතුරු සඳහා අනුමැතිය ලැබී නොමැත.<br>II. අධ්‍යක්ෂ (පුහුණු) තනතුර හා උපදේශක තනතුරු 14 ක් සඳහා බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කරමින් පවතී. |
| 2024 (03) (vi) | වෘත්තීය පුහුණු අංශය සඳහා බඳවාගැනීම් සිදුකිරීමේදී විශ්වවිද්‍යායේ තනතුරු හා වෘත්තීය පුහුණු අංශයේ තනතුරු අතර වැටුප් කේත දෙකක් ලබා දීම හේතුවෙන් ගැටළු නිර්මාණය වී ඇති බවට කමිටුවට කරුණු ඉදිරිපත් කරන ලදි.<br>ඒ පිළිබඳව කමිටුවේ අවධානය යොමු කළ අතර ඒ සඳහා පාලන සභාවේ අනුමැතිය ලබාගෙන කැබිනට් පත්‍රිකාවක් සකස් කර කැබිනට් මණ්ඩලය මට්ටමේ කමිටුවක් පත්කර එම කමිටුවේ නිර්දේශ ලබාගෙන කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීම. | මෙම ප්‍රතිපත්තිමය කාරණය පිළිබඳව රේඛීය අමාත්‍යාංශ මට්ටමින් සාක්වඡා කරමින් පවතී. |

| | | |
|---|---|---|
| 2024 (03) (vii) | වෘත්තීය පුහුණු අංශය වෙත අනුයුක්ත කර ඇති අධ්‍යයන කාර්ය මණ්ඩලය ප්‍රාදේශීය මධ්‍යස්ථානවල අතර හුවමාරු කරගැනීමට හැකිවන සැලසුමක් සකස් කරන ලෙස ප්‍රාදේශීය මධ්‍යස්ථානවල සහකාර අධ්‍යක්ෂවරුන් වෙත උපදෙස් ලබාදී ඇති බවත් අධ්‍යක්ෂ (පුහුණු) වැ.බ. විසින් කරුණු දැක්විණි.<br>අධ්‍යයන කාර්ය මණ්ඩලය උපරිම සේවයක් ලබාගැනීමට හැකිවන පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩල උපයෝජන සැලසුමක් සකස් කර පාලන සභාවට ඉදිරිපත් කිරීම. | මෙහි ප්‍රගතිය පිළිබඳව එළඹෙන කමිටු රැස්වීමේදී විමසීම් කර ක්‍රියාත්මක කරනු ඇත. |
| 2024 (03) (viii) | යාපනය හා මඩකලපුව ඒකකයේ සහකාර අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කලද නිත්‍ය තනතුරට අදාළව දේශන කටයුතු ඉටු කිරීම සිදුකළ යුතු බවට එම නිලධාරින් වෙත ලිඛිත උපදෙස් ලබාදීම සඳහා සහකාර ලේඛකාධිකාරි (මානව සම්පත්) ගේ අවධානය යොමු කිරීම. | මේ පිළිබඳව මඩකලපුව සහකාර අධ්‍යක්ෂ වෙත ලිඛිතව දන්වා ඇත. |
| 2024 (03) (iX) | කොන්ත්‍රාත් පදනම් මත බඳවාගෙන සිටින කාර්ය මණ්ඩල සේවා දිගු ලබාදීමේදී සිදුකර ඇති අධ්‍යයන පැය ප්‍රමාණයන් සහිතව පාලන සභා පත්‍රිකා ඉදිරිපත්කිරීම. | මෙම කාර්යය ක්‍රියාත්මක කර ඇත. |
| 2024 (03) (X) | ස්ථිර/ කොන්ත්‍රාත් පදනම් මත බඳවාගෙන ඇති අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් අධ්‍යයන කටයුතු සඳහා ඉහල දායකත්වයක් දක්වා ඇති නිලධාරින් ඇගයීමට ලක්කිරීමට හැකියාව තිබේනම් ඒ සඳහා ශාස්ත්‍රීය සභාවේ අවධානය යොමුකර එහි නිර්දේශ අනුව කටයුතු කිරීම. | මෙම කාර්යය ඉටු වී නොමැති අතර ඉදිරියේදී මේ පිළිබඳව අවධානය යොමුකරනු ඇත. |

**<u>IV වන රැස්වීම.</u>**

- පාලන මණ්ඩල සාමාජිකයින් පත්කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2024 (IV) වන රැස්වීම පැවැත්වීමට නොහැකි විය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වසන්ත රත්නායක, PhD.
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
මට්ටක්කුලිය
කොළඹ 15.

.................................................

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි ඡේද අංක 07 ට අනුව, පාරිතෝෂික ගෙවීම් ප්‍රමාද වීම මත නිලධාරීන් 6 දෙනෙකුට ගෙවිය යුතු අධිභාර වටිනාකම රු.715,458 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු අධිභාර ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි ඡේද අංක 48 අනුව, වත්කම්,වගකීම් සහ ආදායම් හා වියදම් වෙන වෙනම වාර්තා කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකර පාරිතෝෂිත ගෙවීමේදී නිලධාරීන්ගෙන් කරන ලද අඩු කිරීම් අදාල පාරිතෝෂිත වියදම් ගිණුමට බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා වියදම රු.463,018 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි ඡේද අංක 14 අනුව, බුස්ස සාගර විශ්ව විද්‍යාල ගොඩනැගිල්ල අදියර II හි නවීකරණ කටයුතු 2021 නොවැම්බර් 04 දින අවසන් කර තිබුනද, ඒ




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

සඳහා දරන ලද රු.මිලියන 16.36 ක් ගොඩනැගිලි වත්කම් ලෙස ප්‍රාග්ධනීත නොකර කෙරීගෙන යන වැඩ ලෙස වාර්තා කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි වටිනාකම එම අගයෙන් අඩුවෙන් හා කෙරීගෙන යන වැඩ වටිනාකම වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි. තවද ඊට අදාල 2021 නොවැම්බර් 04 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලයට ගිණුම්ගත කල යුතු ක්ෂය වටිනාකම වූ රු.1,174,594 ක් මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබිණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 ඡේද අංක 16 අනුව,සේවා ආදායම නිමකිරීමේ ප්‍රතිශතය මත හඳුනාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබී තිබුණු පාඨමාලා 08 ක ආදායම රු.22,008,750 ක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ හඳුනාගෙන එම වටිනාකම නැවත කලින් ලද ආදායමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයට සිදු කරනු ලබන ගැලපීමක් ලෙස අතිරික්තයෙන් අඩු කර තිබීම හේතුවෙන් ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් හා හිමිකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 ට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී පාඨමාලා 20 කට අදාලව රු. 37,611,680 ක මුළු ආදායමක් උපයා තිබුණු අතර එක් පාඨමාලාවකට අදාලව ඉපයූ ආදායමක් ගිණුම් ගත නොකර රු.929,445 ක වියදමක් පමණක් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.එසේම, සමාලෝචිත වර්ෂය තුළදී පාඨමාලා 08 කට අදාලව රු.5,725,950 ක ආදායමක් ගිණුම්ගත කර තිබුණ ද ඒ සඳහා කිසිදු වියදමක් මූල ප්‍රකාශන තුළ දක්වා නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 ට අදාලව හුවමාරු නොවන ගණුදෙනුවලින් ලද මුදල් අදාළ වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට පෙර රජය සහ ව්‍යාපෘති විසින් විශ්ව විද්‍යාලය වෙත දෙන ලද එකතුව රු. 955,123,309 ක් වූ ප්‍රධාන ආදායම් ලෙස හඳුනා නොගෙන වෙනම සංචිත ලෙස මූල්‍ය ප්‍රකාශන මඟින් දක්වා තිබීම හේතුවෙන් එම අගයෙන් සමුච්චිත අතිරික්තය අඩුවෙන්ද අදාල ප්‍රාග්ධන හා අයභාර සංචිත වටිනාකම වැඩියෙන්ද දක්වා තිබුණි.

(උ) විශ්ව විද්‍යාල සිසුන්ගෙන් අය කර ගනු ලබන ආපසු ගෙවිය යුතු රු.1,550,832 ක් වූ පුස්තකාල තැන්පතු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හිමිකම් යටතේ ප්‍රාග්ධන හා සංචිත ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට පැවති හිමිකම් වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද වගකීම වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි.

(ඌ) විශ්ව විද්‍යාල ආචාර්යවරුන් විදේශගත වීමේදී විශ්ව විද්‍යාලය සමඟ ඇතිකරගනු ලැබූ ගිවිසුම් කඩකිරීම් හේතුවෙන් අදාල ආචාර්යවරුන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ මුදලින් ලද වටිනාකම රු.3,119,677 ක් පමණක් ලෙජර ගිණුම තුළ හඳුනාගෙන තිබූ අතර ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය වන විට නිලධාරීන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.2,966,856 ක වටිනාකම ලැබිය යුතු මුදල් ලෙස සටහන් නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් හා හිමිකම් වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 විශ්ව විද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් බලාපොරොත්තු වන විශ්ව විද්‍යාලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන

වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව,මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්,එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ.මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්ව විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්ව විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්ව විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්ව විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්ව විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පදනම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ) ඡේදයේ දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාලයේ යම් සාමාජිකයෙකුට විශ්ව විද්‍යාලය සම්බන්ධව් යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට පදනමේ හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 396(ඇ) | මාස 06 කට වඩා වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ වටිනාකම රු.904,298 ක් වූ චෙක්පත් 16 ක් සම්බන්ධව මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) | චක්‍ර ලේඛ විධි විධාන වලින් බැහැරව අවස්ථා 09 ක දී රු.103,000 සිට රු.,1,047,596 දක්වා පරාසයක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඇ) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වන ඡේදය | විශ්ව විද්‍යාල ආචාර්යවරුන් විදේශගත වීමේදී ඇතිකරගනු ලැබූ බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද ආචාර්යවරු 06 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබූ රු.3,119,677 ක මුදල භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2010 අගෝස්තු 12 දිනැති අංක 445 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා ආරක්ෂක සේවා ලබා ගැනීමේදී රජය සතු සමාගම් සතුව ආරක්ෂක ක්ෂේත්‍රයෙහි මනා පළපුරුද්දක් සහිත කාර්යමණ්ඩලයක් සිටින බැවින් එම සේවා ලබා ගැනීමට පෙර/දැනට ඇති සේවා ගිවිසුම් නැවත අළුත් කිරීමට පෙර රජය සතු ආරක්ෂක සේවා සපයන සමාගම් වලින් එම සේවා සපයා ගත හැකි ද යන්න පිළිබඳව පූර්ව විමසීමක් සිදුකල යුතු වුවත්,ඊට පටහැනිව 2024 ජූනි 01 සිට 2025 මැයි 31 දක්වා වූ කාලය සඳහා ආරක්ෂක සේවය ලබා ගැනිම වෙනුවෙන් රු.1,262,520 ක් ගෙවීමට පෞද්ගලික ආරක්ෂක ආයතනයක් සමහ ගිවිසුමකට එළඹී තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාල බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| බලතල, කර්තව්‍ය හා කාර්යයන් | අනුකූල නොවීම් |
|---|---|
| 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 66 වන වගන්තිය | 2014 මාර්තු 26 දිනැති හා අංක 06/2014 දරන විශ්ව විද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය මගින් නියම කළ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන අංශ සඳහා විනෝදාශ්වාද දීමනා ලෙස පනතට පටහැනිව රු.2,619,166 ක් ගෙවා තිබුණි. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්ව විද්‍යාල සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3** වෙනත් කරුණු

(අ) ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පස් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා උපදේශන ගාස්තු රු.6,126,551ක් හා පාංශු පරීක්ෂණ කටයුතු සඳහා රු.367,557 ක් ලෙස දරන ලද එකතු වටිනාකම රු. 6,494,108 ක මුදල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම ආරම්භ කිරීමේ කටයුතු මේ දක්වාම ඉටු වී නොතිබීම හේතුවෙන් නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. එසේම, සහනදායී ණය පහසුකම් ලබා ගැනීමේ ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේදී පරිසර සහතිකය ඇතුළු වියදම් සඳහා ද රු.1,513,936 ක වියදමක් මේ වෙනුවෙන් දරා තිබුණි.

(ආ) 2018 වර්ෂයේදී අධ්‍යයන සහ පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා බදු කුළී පදනම මත ගොඩනැගිල්ලක් කුලියට ගෙන තිබූ අතර ඒ වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින වන විට ගොඩනැගිලි කුලී හා ජලය හා විදුලි වියදම් ලෙස පිළිවෙලින් රු. 200,724,819 ක් හා රු.21,421,803 ක් ගෙවා තිබුණි. 2016 වර්ෂයේදී අනුමත වූ රු.මිලියන 300 ක ප්‍රතිපාදන යොදාගෙන ගොඩනැගිල්ල ඉදිකිරීමට සැලසුම් කරන ලද්දේ නම් ගොඩනැගිලි කුලී ලෙස බාහිර පාර්ශවයකට ගෙවන ලද මුදල් ඉතිරි කර ගැනීමට හා විශ්වවිද්‍යාලය වෙත වත්කමක් ලබා ගැනීමට හැකි වී තිබිණි.

(ඇ) ලෝක බැංකු ආධාර (AHEAD) යටතේ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය කටයුතු, විභාග, මූල්‍ය, පරිපාලන හා වෙනත් සාමාන්‍ය කටයුතු ස්වයංක්‍රියකරණය කිරීම සඳහා Integrated Education Management Information System (IEMIS) නමින් 2021 අගෝස්තු 31 දින සිට 2022 පෙබරවාරි 26 (දින 180) දින දක්වා වූ කාලසීමාවක් සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹී තිබුණු අතර එම පෞද්ගලික ආයතනය 2027 පෙබරවාරි 06 දින දක්වා මෙම තොරතුරු පද්ධතියට අදාල සේවා පහසුකම් ලබා දීමට එකඟ වී තිබුණි. විගණිත දිනය වූ 2025 ජූනි 04 දින වන විටත් මෙම ව්‍යාපෘතිය මගින් නිර්මාණය කළ ආදර්ශක (Modules) 14 ම නිසි පරිදි භාවිතයට ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් සේවා සැපයීමේ පිරිවැය වූ රු.2,675,400 ක මුදල ඇතුළුව ඒ සඳහා වැය කරන ලද රු.9,882,600 ක සම්පූර්ණ මුදලම නිෂ්කාර්ය වී තිබුණි. මීට අමතරව, 2023 ජූනි 05 සිට 2025 ජූනි 05 දක්වා කොන්ත්‍රාත් පදනම මත තොරතුරු තාක්ෂණ උපදේශකවරයෙකු බඳවාගෙන මාසිකව රු.80,000 ක දීමනාවක් ද මේ සඳහා ගෙවා තිබුණි.

(ඈ) එකතුව රු.13,329,183 ක් වූ වසර 3 ඉක්මවා ඇති ලැබිය යුතු ශේෂය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඉ) ගෙවිය යුතු ශේෂය තුළ ඇතුළත් වසර 01සිට 02 දක්වා කාලයක සිට පවතින රු.3,546,667 ක් හා වසර 02 කට වැඩි කාලයක සිට පවතින රු. 4,012,157 ක ශේෂයන් පියවීමට මේ දක්වාම කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 කට වැඩි කාලයක සිට පැවත එන රු.2,496,836 ක් වූ උපචිත වියදම් නිරවුල් කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඊ) විශ්වවිද්‍යාලයට හා ප්‍රාදේශීය ආයතනයන්ට අදාල අනුමත තනතුරු 32 ක් සඳහා සේවකයන් 158 ක ඌනතාවයක් වූ අතර තනතුරු 08 ක් සඳහා සේවකයන් 37 දෙනෙකු අතිරික්තව සේවයේ යොදවා තිබුණි.

(උ) තනතුරු 08 ක් සඳහා අතිරික්තව සිටින නිලධාරීන් 09 දෙනෙකුගේ තනතුරු අනුමත කර ගැනීමකින් තොරව එම නිලධාරීන් බඳවා ගෙන වැටුප් හා දීමනා ලෙස රු.12,351,193 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඌ) ආයතනයට හා උප ආයතනයන්ට අදාලව සේවය කරනු ලබන කාර්යය මණ්ඩලය සඳහා පාරිතෝෂිත ගණනය කිරීම, උපලේඛනයට අනුව එකතුව 180 ක් වුවද විගණනය සඳහා ඉදිරිපත් කළ තොරතුරු අනුව එකතුව 213 ක් වීම හේතුවෙන් සේවකයන් 33 ක වෙනසක් නිරීක්ෂණය විය.

ජී.ඩබ්.එ.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

## 11. විගණකාධිපති වාර්තාවට කරන ලද පැහැදිලි කිරීම්

ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
இலங்கை சமுத்திர பல்கலைக்கழகம்
**Ocean University of Sri Lanka**
**Office of the Vice Chancellor**
කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15. காக்கைதீவு, மட்டக்குளி, கொழும்பு 15. Crow Island, Mattakkuliya, Colombo 15.

| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. OCU/05/02/36/2024/FA/05(i) | ඔබේ අංකය. / உங்களது இல. / Your No. VOT/E/OUSL/2024/FA/05 | දිනය. / திகதி. / Date. 2025.10.31 |

කේ.කේ.එස්. ජයකොඩි මහතා,
නියෝජ්‍ය විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

**<u>ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.</u>**

ඉහත කරුණට යොමුව ඔබගේ සමාංක 2025.09.25 දිනැති විගණකාධිපති වාර්තාව සඳහා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග හා ඊට අදාළ ප්‍රගතිය සඳහන් කරමින් සකස් කරන ලද වාර්තාව මේ සමඟ එවමි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නලින් රත්නායක PhD,
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නලින් රත්නායක
උපකුලපති
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය
මට්ටක්කුලිය

පිටපත් :

01. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය.
02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

Vice Chancellor : Tel (Office) +94 (0) 11 7112650 Fax : +94 (0)11 2525102 E-mail : vc@ocu.ac.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම.**

(අ) රියදුරු තනතුරේ සේවය කරන ලද ලාල් රංජිත් පතිරණ මහතා විගණන විමසුමකට අදාළ නේවාසිකාගාර කුලී අයකර යුතුව තිබූ බැවින් එම කාරණය නිරවුල් කරන තෙක් පාරිතෝෂිත ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් රු.70,630.00 ක් අධිභාර ගෙවීමට සිදුවූ අතර එම අගය හැර 2025.10.22 දින වන විට අධිභාර ගෙවීම් සිදුවීමක් හෝ ගෙවන ලෙස කරන ලද දැනුම්දීමක් මේ දක්වා විශ්වවිද්‍යාලය වෙත යොමුකර නොතිබුණි.

(ආ) විගණිත කරුණ සමඟ එකඟවන අතර ඉදිරියේදී විගණනයේ මගින් පෙන්වා දී ඇති කරුණු ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත.

(ඇ) 2025 වර්ෂයේ ගිණුම් තුලින් නිවැරදි කිරීම් ජ'නල් සටහන් අංක 03, 04 මගින් සිදුකර ඇත.

(ඈ) විගණිත කරුණ හා එකඟ නොවේ. විමසුමෙහි පාඨමාලා පැවැත්වීමෙන් ලද ආදායම ලෙස දක්වා ඇති රු. 22,008,750.00 වර්ෂයේ ලාභයට දායක නොවිය යුතුය. අදාල පාඨමාලාවන් පවත්වාගෙන යෑම සඳහා වර්ෂ 1 සිට 3 දක්වා ගෙවීම් සිදුකරන අතර එහි වූ සැබෑ ලාභය අදාල පාඨමාලාව අවසන් වන වර්ෂයට අදාළ වන මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් වන තෙක් එම ආදායම ජංගම වගකීමක් ලෙස හඳුනාගැනීම සිදුකරයි. එම තත්ත්වය ගිණුම්කරණ ප්‍රතිපත්ති තුල ද හෙළිදරව් කර ඇත. තවද ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අංක 3 හි 12 වන ඡේදයෙහි දක්වා ඇති නිර්ණායක අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගෙන ඇත. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් යටතේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙන් අතිරික්තයෙන් ඉවත්කර ගිණුම් ඉදිරිපත් කිරීම ගැටළු සහගත නොවේ.

(ඉ) Diploma in Maritime Logistic & Management පාඨමාලාවට අදාල ආදායම පෙර වර්ෂයේ ලැබී ඇති අතර එය සටහන් අංක 19 යටතේ දක්වා ඇති සටහනේ පෙර වර්ෂයෙන් විලම්භනය කර ඇති රු. 1,537,275.00 ආදායමෙන් ගෙවා ඇත.

(ඊ) විගණිත කරුණ සම්බන්ධයෙන් එළඹෙන විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර එම කමිටුවේ නිර්දේශ මත කටයුතු කිරීමට කටයුතු කරනු ඇත.

(උ) විගණිත කරුණ සමග එකඟවන 2025 වර්ෂයේ අවසන් ගිණුම් තුලින් නිවැරදි කර ඉදිරිපත් කෙරේ.

(ඌ) විගණිත කරුණ සම්බන්ධයෙන් එකඟවන අතර 2025 සඳහා ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදි ගිණුම් තුල ඇතුලත් කර ඉදිරිපත් කෙරේ.

**2.2**

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

(අ) මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කරමින් පවතී.

(ආ) අංක 01/2020 සහ අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) ඡේදය සම්බන්ධව දැනුවත් වීමෙන් පසුව විශ්වවිද්‍යාලය කටයුතු කලද වර්තමානයේ පවතින උද්ධමනකාරී තත්ත්වය යටතේ විශ්වවිද්‍යාලය විසින් සැළසුම් කරන ලද වැඩසටහන් තුලවූ පිරිවැය ඉහල යෑම හේතුවෙන් එකී වැඩසටහන් සාර්ථකව පවත්වාගෙන යෑමේ දී සිදුවූ ප්‍රායෝගික ගැටළු සම්බන්ධව අවධානය යොමුකර අදාල අත්තිකාරම් ලබා දී ඇත.

මේ සම්බන්ධව විමසුම් අංක VOT/E/OCUSL/2024/4/ii විමසන ලද අතර එහිදී අවස්ථා 09 ක් බව සඳහන් වුවද විමසුමට ඇතුලත් කර තිබුණේ අවස්ථා 06 ක් පමණි. ඒ සඳහා පැහැදිලි කිරීම පහත පරිදි වන අතරම එම අවස්ථා අතර නොවූ රු 1,047,596 අත්තිකාරම සම්බන්ධයෙන් ද පැහැදිලි කිරීම පහත දක්වමි.

| අ.අ | අත්තිකාරම් ශේෂය (රු.) | පැහැදිලි කිරීම |
|---|---|---|
| 1. | 277,000 | මෙය අත්තිකාරමක් ලෙස ලබා දී ඇත්තේ රාජ්‍ය ආයතනයක් වන (NAQDA) ආයතනය වෙත වන අතර මෙම සේවාව ලබාගැනීමට පෙර ගෙවීම් සිදුකළ යුතු අවස්ථාවකි. මෙම වියදම පුහුණු වියදමක් ලෙස ඍජුවම ගිණුම්ගත නොකර මෙම සේවාව ලබාගැනීම තහවුරු කරනතෙක් අත්තිකාරම් ගිණුමේ සටහන් කර ඇත. මෙම ගෙවීම මුදලින් ද ලබා දී නොමැති අතර අදාල ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් නමින් රේඛණය කරණ ලද චෙක්පත්කින් ලබා දී ඇත. එහිදී මුදල් වෙනත් පාර්ශවකට ලබා දීමේදී සිදුවිය හැකි අවභාවිතාවන් සිදුකිරීමට ද හැකියාවක් නොපවතින අතරම මෙවැනි අවස්ථාවන් වලදී අත්තිකාරම් ලබාදීමේ දී උපරිම සීමාව වූ රු 100,000/- සීමාවෙන් ඉක්මවන මෙවැනි අවස්ථාවලදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් පූර්ව අවසරයකින් යුතුව සිදුකිරීම ප්‍රායෝගික නොවේ. |
| 2. | 153,432 | Open Water Diver පාඨමාලාවේ වියදම් පියවාගැනීම සඳහා තංගල්ල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ගිණුම වෙත බැර කර ඇත. |
| 3. | 130,000 | ධාරිතාව සංවර්ධන වැඩසටහන යටතේ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහනට අවශ්‍ය ශාලා පහසුකම් ලබා ගැනීම සඳහා ගෙවන ලද මුදලකි. අදාල පහසුකම් ලබා ගැනීමට පෙර ගෙවීම් සිදුකළ යුතුව තිබූ අවස්ථාවකි. |
| 4. | 347,000 | නාවික ඉංජිනේරු උපාධි පාඨමාලාවේ විෂයමාලා සංස්කරණය කිරීම සඳහා පැවති වැඩමුළුව සඳහා අවශ්‍ය ශාලා පහසුකම් අනෙකුත් සේවා ලබා ගැනීමට ගෙවා ඇත. අදාල පහසුකම් ලබාගැනීමට පෙර ගෙවීම් සිදුකළ යුතුව තිබූ අවස්ථාවකි. |
| 5. | 500,000 | මෙය අත්තිකාරමක් ලෙස ලබා දී තිබුණේ උපාධි ප්‍රධාන උත්සවය සඳහා බන්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව වෙන්කර ගැනීම සඳහා එම ආයතනය වෙත කළයුතු තිබූ පෙර ගෙවීමකි. මෙම සේවාව ලබාගැනීමට පෙර ගෙවීම් සිදුකළ යුතු අවස්තාවකි. මෙම වියදම පුහුණු වියදමක් ලෙස ඍජුවම ගිණුම්ගත නොකර මෙම සේවාව ලබාගැනීම තහවුරු කරනතෙක් අත්තිකාරම් ගිණුමේ සටහන් කර ඇත. මෙය අත්තිකාරම් ගිණුමේ සටහන්කර තිබුණද මෙම ගෙවීම මුදලින් ද ලබා දී නොමැත චෙක්පතකින් අදාල ආයනය වෙත රේඛණය කරණ ලද චෙක්පත්කින් ලබා දී තිබෙන අතර එහිදී මුදල් වෙනත් පාර්ශවකට ලබා දීමේදී සිදුවිය හැකි අවභාවිතාවන් සිදුකිරීමට ද හැකියාවක් නොපවතින අතරම මෙවැනි අවස්ථාවන් වලදී අත්තිකාරම් ලබාදීමේ දී උපරිම සීමාව වූ රු 100,000/- සීමාවෙන් ඉක්මවන මෙවැනි අවස්ථාවලදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් පූර්ව අවසරයකින් යුතුව සිදුව කිරීම ප්‍රායෝගික නොවේ. |
| 6. | 265,870 | මෙය අත්තිකාරමක් ලෙස ලබා දී තිබුණේ 2025 වර්ෂය සඳහා සිසුන් බඳවාගැනීම සඳහා අවශ්‍ය යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම සඳහා අවශ්‍ය ශාලා පහසුකම් ලබාගැනීම සඳහා වේ. මෙය කලින් සිදුකර ගත යුතුව තිබුණු ශාලා වෙන්කරගැනීම සඳහා ආනන්ද විද්‍යාලය වෙත කළයුතු තිබූ පෙර ගෙවීමකි. මෙම සේවාව ලබාගැනීමට පෙර ගෙවීම් සිදුකළ යුතු අවස්ථාවකි. මෙම සේවාව ලබාගැනීම තහවුරු කරනතෙක් අත්තිකාරම් ගිණුමේ සටහන් කර ඇත. මෙය අත්තිකාරම් ගිණුමේ සටහන්කර තිබුණද මෙම ගෙවීම මුදලින් ද ලබා දී නොමැත අදාල ආයනය වෙත රේඛණය කරණ ලද චෙක්පත්කින් ලබා දී ඇත. එහිදී මුදල් වෙනත් පාර්ශවකට ලබා දීමේදී සිදුවිය හැකි අවභාවිතාවන් සිදුකිරීමට ද හැකියාවක් නොපවතින අතරම මෙවැනි අවස්ථාවන් වලදී අත්තිකාරම් ලබාදීමේ දී උපරිම සීමාව වූ රු 100,000/- සීමාවෙන් ඉක්මවන මෙවැනි අවස්ථාවලදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් පූර්ව අවසරයකින් යුතුව සිදුකිරීම ප්‍රායෝගික නොවේ. |
| 7. | 1,047,596 | මෙය අත්තිකාරමක් ලෙස ලබා දී තිබුණේ උපාධි ප්‍රධාන උත්සවය සඳහා බන්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව වෙන්කර ගැනීම සඳහා එම ආයතනය වෙත කළ යුතුව තිබූ පෙර ගෙවීමකි. මෙම සේවාව ලබාගැනීමට පෙර ගෙවීම් සිදුකළ යුතු අවස්ථාවකි. මෙම වියදම පුහුණු වියදමක් ලෙස ඍජුවම ගිණුම්ගත නොකර මෙම සේවාව ලබාගැනීම තහවුරු කරනතෙක් අත්තිකාරම් ගිණුමේ සටහන් කර ඇත. මෙය අත්තිකාරම් ගිණුමේ සටහන්කර තිබුණද මෙම ගෙවීම මුදලින් ද ලබා දී නොමැත. අදාල ආයනය වෙත රේඛණය කරන ලද චෙක්පත්කින් ලබා දී තිබෙන අතර එහිදී මුදල් වෙනත් පාර්ශවකට ලබා දීමේදී සිදුවිය හැකි අවභාවිතාවන් සිදුකිරීමට ද හැකියාවක් නොපවතින අතරම මෙවැනි අවස්ථාවන් වලදී අත්තිකාරම් ලබාදීමේ දී උපරිම සීමාව වූ රු 100,000/- සීමාවෙන් ඉක්මවන මෙවැනි අවස්ථාවලදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් පූර්ව අවසරයකින් යුතුව සිදුව කිරීම ප්‍රායෝගික නොවේ. |

(ඇ) විමසුමේ මගින් පෙන්වා දී ඇති 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද චක්‍රලේඛ ලිපියේ 05 වන ඡේදය

ප්‍රකාරව කටයුතු කර 2025.10.10 දින චෙක්පත් අංක 150833 මගින් රාජ්‍ය අදායමට බැරකර තිබේ. (ඇමුණුම 01)

(ඈ) අදාල චක්‍රලේඛය 2010 වර්ෂයේ නිකුත්කර තිබූ අතර 2024 දක්වා ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. කෙසේ වෙතත් 2025/26 වර්ෂයේ ආරක්ෂක සේවා ගිවිසුම් අත්සන් කිරීමට පෙර රාජ්‍ය ආයතන වෙතින් මිල විමසීම් කෙරිණි. ඒ අනුව සී/ස රක්නා ලංකා ආරක්ෂක ආයතනය විසින් රු 32,954,072.00 ක (වැට් ඇතුලත්ව) ලංසුවක් ඉදිරිපත් තිබූ අතර තරගකාරී ලංසු කැඳවීම මත රු24,679,110 ක අවම ලංසුවක් ඉදිරිපත්කර තිබූ ආයතනය මගින් අදාල සේවාව ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණි. ප්‍රසම්පාදන කමිටු වාර්තාවේ පිටපතක් මේ සමඟ යොමු කෙරේ. (ඇමුණුම 02)

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ද) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාල බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව නොවන ලෙස කටයුතු කර ඇති බව,
2014 අංක 31 දරණ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාල පනතේ 20 (2) (1) (ඌ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට හිමිකම් ඇති වෙනත් ප්‍රතිලාභ කලින් කලට නිශ්චය කිරීමට විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලයට ලබා දී ඇත. ඒ අනුව 2020/09/03 දින 44 වන පාලන මණ්ඩල අනුමැතිය පරිදි අදාල ගෙවීම් සිදුකර ඇත. පාලන මණ්ඩලයේ අනුමැති ලබාගත් රැස්වීම් සටහනේ පිටපතක් මේ සමඟ ඉදිරිපත් කරමි. (ඇමුණුම 03)

**2.3 වෙනත් කරුණු.**

(අ) ජාතික අය - වැය දෙපාර්තුමේන්තුව විසින් 2016 වර්ෂයේ රු. මි. 300 ක අතිරේක ප්‍රතිපාදන වෙන්කිරීම් මත ඒ අනුව පස්මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැළසුම් කරන ලදි. ඊට අදාළ මූලික පියවර ලෙස ඇස්තමේන්තු සකස් කිරීම හා පාංශු පරීක්ෂණ කටයුතු සිදුකරන ලද අතර ඒ සඳහා ගෙවීම් සිදුකරන ලදි. එම කටයුතු 2016 වර්ෂයේ හෝ ඉන් පසු වර්ෂයේ ආරම්භ නොකිරීම් හේතුවෙන් ඉදිරි වර්ෂවලදී ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදුකර නොතිබිණි.

සහනදායී ණය පදනම මත ගොඩනැගිලි සංකීරණයක් ඉදිකිරීම සඳහා යෝජනාව පැවති මට්ටක්කුලිය කාකදූපත පරිශ්‍රය හා නාරා ආයතන පරිශ්‍රය ඇතුලුව සම්පූර්ණ ඉඩම සඳහා යෝජනා කළද නාරා පරිශ්‍රයේ වූ කඩොලාන පරිසර පද්ධතියකින් යුතු වීම නිසා පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව (EIA Report) ලබාගැනීමට නොහැකි විය.

මට්ටක්කුලිය පරිශ්‍රය වෘත්තීය පුහුණු අංශයද පවතින බැවින් විශ්වවිද්‍යාලය සඳහා ගොඩනැගිලි සංකීරණයක් ඉදිකිරීම සඳහා අක්කර 04 ක භූමි ප්‍රමාණයක් ප්‍රමාණවත් නොවිණි. එම නිසා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව මේවන විට ගොඩනැගිලි සංකීරණයක් ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් භූමි කොටසක් සොයා ගෙන ඇති බව සඳහන් කරමි.

(ආ) 2016 වර්ෂයේ අනුමත රු. මි. 300 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද එම වර්ෂයේ ගොඩනැගිල්ල ඉදිකිරීම් ආරම්භ කිරීමට නොහැකි වී තිබිණි. මට්ටක්කුලිය විශ්වවිදයාල පරිශ්‍රයේ පවතින ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2017 වර්ෂයේ සිට ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට සිදුවූ අතර ඒ ගොඩනැගිල්ල භාවිතයට ගැනීමෙන් ශිෂ්‍ය ධාරිතාවය වර්ධනය කර ගැනීමටත් පුස්තකාල, දේශන ශාලා, නව අධ්‍යාපන කාර්ය මණ්ඩල ඉඩ පහසුකම් ලබාදීමට හැකි විය.

මේවන විට වර්ධනය වන ශිෂ්‍ය ධාරිතාවය මත විශ්වවිද්‍යාලය සඳහා ගොඩනැගිලි පරිශ්‍රයක අවශ්‍යතාවය මතුව ඇති අතර ඒ සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම හෝ රජයේ ගොඩනැගිල්ලක් සොයාගැනීමට මූලික කටයුතු ආරම්භ කර විශ්වවිද්‍යාලයේ හා රේඛීය අමාත්‍යාංශයේ අවධානය යොමුකර ක්‍රියාත්මක කරමින් පවතී.

(ඇ) මේවන විට උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීමට අදාළ කටයුතු මෙම පද්ධතිය මගින් සිදුකිරීම ආරම්භ කර ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු වැඩසටහන්

පැවැත්වූවද තොරතුරු ඇතුලත් කර ක්‍රියාත්මක කරවාගැනීමේදී ගැටළු තත්ත්වයන් පැවතිණි. එම නිසා මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනමම ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මෙම පද්ධතින් ක්‍රියාත්මක කිරීමට දැනුම්දීමකින් යුතු සේවක සංඛ්‍යාවන් බඳවාගැනීමට අවශ්‍ය යෝජනාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යවා ඇත. මෙම පද්ධතිය පිළිබඳව ආයතන විගණන හා කළමනාකරණ කමිටුවේ අවධානය යොමුකර තිබූ අතර මෙම පද්ධතියේ LMS කොටස ක්‍රියාත්මක කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි නිලධාරියා සඳහා නිසි මග පෙන්වීමක් සිදු නොවීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබූ අතර එම නිලධාරියා පූර්ණ කාලීනව මෙම කටයුතු සඳහා යොදවා ඇත. මෙම පද්ධතිය සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් බඳාවාගන්නා තෙක් පද්ධතිය පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය මත කොන්ත්‍රාත් පදනම මත තොරතුරු තාක්ෂණ උපදේශකවරයකුගේ සේවය ලබාගැනීමට සිදුවේ.

(ඇ) මෙම ශේෂයන් නිරවුල් කිරීම සම්බන්ධව ද විශ්වවිද්‍යාලය විසින් අවස්ථා කිහිපයකදීම විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ පරිදි විශ්වවිද්‍යාලයේ පාලන මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. එම ශේෂයන් අයවිය යුතු පාඨමාලා ගාස්තු රු. 5,913,500.00ක මුදල පිළිබඳව අමාත්‍ය මණ්ඩල සංදේශයේ නිර්දේශ හා අනුමැතිය ප්‍රකාරව කටයුතු කරමින් පවතුන ද මේ දක්වා එකී ශේෂයන් ලියා හැරීම සඳහා අවශ්‍ය නිසි අනුමැතිය මේ දක්වා ලැබී නොමැත. නිරවුල් නොවූ උපචිත වියදම් 2025 වර්ෂයේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදායමට ගැලපීමට කටයුතු කරනු ලැබේ.

| විස්තරය | 2024.12.31 දිනට ලැබිය යුතු ශේෂයේ වටිනාකම | වර්තමාන තත්ත්වය |
|---|---|---|
| Refundable Deposits (Electricity NARA) | 218,750 | නාරා ආයතනය සතුව තබා ඇති තැන්පතුවකි. මේ සම්බන්ධයෙන් සියලු තොරතුරු ඇතුලත් වාර්තාවේ පරිලෝකනය කරන මෘදු පිටපත විගණන අංශය වෙත ඉදිරිපත්කර ඇත. |
| Advances | 4,164,447 | උක්ත වාර්තාව පදනම්ව මෙම ශේෂයෙන් රු 3742167/- ක ශේෂයක් නිරවුල් කිරීමට පාලන මණ්ඩල අනුමැතිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021 ප්‍රකාරව කටයුතු කරමින් පවතී. |
| Deposits (Hostel) | 1,660,000 | මෙම අගයන් රු. 840,000.00 ක් අයකරගැනීම සඳහා නීතිපති දෙපාර්තුමේන්තුවට යොමුකර ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරි කටයුතු කරමින් පවතී තත්ත්කාලීනව පවත්වාගෙන යයි.<br>විනීවිතාරණ ගොඩනැගිල්ල - රු. 480,000.00<br>පියසේන වීරතුංග ඒකනායක ගොඩනැගිල්ල - රු. 330,000.00 |
| Course Fees Receivables-Higher education | 6,946,990 | මෙම ශේෂයෙන් රු5,913,500/- ලියා හැරීම සඳහා 2024.07.17 දින ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශයේ නිර්දේශ හා අනුමැතිය ප්‍රකාරව කටයුතු කරමින් පවතී. |
| Ceylon Oxygen House | 48,000 | තත්ත්කාලීනව පවත්වාගෙන යයි. |
| Refundable Tender Deposits - Nara | 277,960 | තත්ත්කාලීනව පවත්වාගෙන යයි. |
| Advanced Payment Boossa - Stage 2 | 313,801 | වැඩ අවසන් කර නොමැත. |
| Advance - Obtaining Fuel from Oriental Fuel station Mattakkuliya | 200,000 | තත්ත්කාලීනව පවත්වාගෙන යයි. |
| Fantence | 557,450 | වැඩ අවසන් කර නොමැත. |
| Constructions | 665,876 | වැඩ අවසන් කර නොමැත. |
| Over Payment | 284,399 | අයකරගනිමින් පවතී. |
| | **15,337,673** | |

(ඉ) අදාල උපචිත වියදම් සම්බන්ධව කටයුතු කරමින් සිටින අතර මුදල් රෙගුලාසි අංක 570(3) ප්‍රකාරව කටයුතු කරමින් පවතින අතර 2025 වර්ෂයේ අවසන් ගිණුම් ඉදිරිපත් කිරීමේදී අදාල ගැලපීම් සහිතව ඉදිරිපත් කරනු ලැබේ.

(ඊ) <u>තනතුරු 32 ක් සඳහා සේවකයින් 158 ක ඌණතාවයක් පැවැතීම.</u>

වසර කිහිපයක සිට බඳවාගැනීම් සීමා කිරීම හා බඳවාගැනීමේ පටිපාටි අනුමත නොවීම හේතුවෙන් සේවක ඌණතාවයක් පැවතිණි.

- ➢ එමෙන්ම, වෘත්තීය පුහුණු අංශය සඳහා DMS 30 යටතේ වැටුප් කේත අනුමත කිරීම හේතුවෙන් ඇති වූ ගැටළුකාරි තත්ත්වය මත වෘත්තිය පුහුණු අංශය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවාගැනීමට නොහැකිවිය.
- ➢ මේවන විට රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩල කළමනාකරණය කිරීමේ කමිටුව මගින් අනුමැතිය ලබාදී ඇති උපදේශක තනතුරු 14 ක් සඳහා බඳවාගැනීමට කටයුතු කරමින් පවති. වෘත්තීය පුහුණු අංශයේ සහකාර උපදේශක, සහකාර අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවාගැනීමේ පටිපාටි අනුමත කර නොතිබීම හේතුවෙන් බඳවාගැනීමට නොහැකිවී ඇත. කෙසේ වුවත් එම බඳවාගැනීමේ කටයුතු අනුමත කිරීමේ අවසන් අදියරේ පවතින බව කළමනාකරණ සේවා දෙපාර්තමෙන්තුව වාචිකව දැනුම්දී ඇත.
- ➢ මේවන තෙක් තත්‍ය කාර්ය මණ්ඩලය කළමනාකරණ කරගනිමින් හා බාහිර පදනම, කොන්ත්‍රාත් පදනම මත බඳවාගනිමින් අධ්‍යයන කටයුතු සිදුකර සැළසුම් ක්‍රියාත්මක කරමින් ප්‍රගතින් අත්කරගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත.

<u>තනතුරු 08 ක් සඳහා සේවකයින් 37 ක අතිරික්තව පැවතීම.</u>

<u>පරිපාලන අංශය.</u>

- ➢ විශ්වවිද්‍යාලය සඳහා අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව තුළ සැළසුම් අංශය, ප්‍රවාහන අංශය අනුමත නොවීම හේතුවෙන් එම කාර්යයන්ද මෙම අංශය මගින් ඉටුකිරීම සඳහා මෙම නිලධාරින්ගේ සේවය ලබාගෙන ඇත.
- ➢ තනතුරු 08 ක් සඳහා සේවකයින් 37 ක් අතිරික්ත සේවයේ බඳවාගැනීමේ සඳහන් අතිරේක සේවකයින් 37 ක් ලෙස දක්වා ඇති කරුණු සමග එකඟ නොවන අතර එම තනතුරු ජාතික ධීවර හා නාවික ඉංජිනේරු ආයතනයේ නිලධාරින්/ සේවකයින් අන්තර්ග්‍රහණයේ දී දරන්නාට පුද්ගලික වනසේ හෝ ජාතික වැටුප් කොමිෂන් සභාවේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අන්තර්ග්‍රහණ අනුමැතියට අනුව අන්තර්ග්‍රහණය කර ඇති තනතුරු වේ.
- ➢ ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව තුළ සඳහන් ඒ ඒ අංශවල පවතින පුරප්පාඩු පැවතිම හේතුවෙන්, බඳවාගැනීම් සීමාකිරීම් හා බඳවාගැනීමේ පටිපාටින් අනුමත නොවීම හේතුන් මත එම අංශවල කාර්ය හා කර්තව්‍ය අඛණ්ඩව පවත්වාගනිමින් වාර්ෂික ක්‍රියාකාරි සැළසුමේ ඉලක්ක ඉටුකර ගැනීම සඳහා එම සේවකයින් යොදාගෙන ඇත.
- ➢ මේවන විට එම අංශවල පවතින පුරප්පාඩු සඳහා බඳවාගැනීමට අනුමැතිය ලැබී ඇති තනතුරු සඳහා බඳවාගැනීමෙන් පසු එම කරුණු නිවැරදි කරගත හැකි බව සඳහන් කරමි.

(ල) විමසුමේ සඳහන් තනතුරු 08ක් ජාතික නාවික හා ඉංජිනේරු ආයතනයේ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය අන්තර්ග්‍රහණය කිරීමේදී පෞද්ගලික වනයේ හෝ ජාතික වැටුප් කොමිෂමේ සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අන්තර්ග්‍රහණයට අදාලව ලබාදුන් අනුමැතියට අනුව ඒ ඒ අංශවල අනුයුක්ත කළ තනතුරු වේ.

| අනු අංකය | අංශය | තනතුරු |
|---|---|---|
| 01. | මානව සම්පත් අංශය | සහකාර ලේඛකාධිකාරි |
| 02. | විභාග අංශය | විද්‍යාල උපදේශක 02, මේවන විට ඉල්ලා අස්වී ඇත. |
| 03. | ශිෂ්‍ය කටයුතු අංශය | සහකාර ලේඛකාධිකාරි |
| 04. | පරිපාලන අංශය | සහකාර අධ්‍යක්ෂ |
| 05. | නඩත්තු අංශය | සහකාර ලේඛකාධිකාරි |
| 06. | උසස් අධ්‍යාපන අංශය | විද්‍යාල උපදේශක |
| 07. | වෘත්තීය පුහුණු අංශය | විද්‍යාල කථිකාචාර්ය |

(ළ) ස්ථිර පදනම මත බඳවාගෙන සිටින කාර්ය මණ්ඩලය සඳහා වෙන්කරන අතර ඉදිරි වර්ෂයේ සිට කොන්ත්‍රාත් පදනම මත බඳවන කාර්ය මණ්ඩලයටද වෙන්කිරීම් කිරීමට කටයුතු කිරීමට උපදෙස් ලබාදෙන ලදි.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නලීන් රත්නායක PhD,
උපකුලපති,
ශ්‍රී ලංකා සාගර විශ්වවිද්‍යාලය.

# 12.මූල්‍ය විග්‍රහය - 2014 – 2023 වසර 10ක කාලසීමාව

| මෙහෙයුම් ආදායම | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| රජයේ ප්‍රදාන හා පුනරාවර්තන වියදම් | 105,000,000 | 139,000,000 | 175,000,000 | 247,161,000 | 309,048,000 | 325,340,000 | 377,767,500 | 375,333,000 | 404,580,000 | 500,000,000.00 |
| ආංශික සංවර්ධන ව්‍යාපෘති පුනරාවර්තන ප්‍රදාන | 3,283,725 | 3,689,750 | 9,115,566 | 17,775,769 | 5,260,873 | 4,177,597 | 6,365,418 | 1,187,393 | | |
| වෙනත් ආදායම් | 41,184,699 | 49,440,512 | 22,260,644 | 4,753,879 | 11,575,725 | 4,617,834 | 11,503,957 | 28,159,493 | 29,250,010 | 70,223,766 |
| රජයේ ප්‍රදාන - පුනරුත්ථාපන සහ වෙනත් | | | | | | | | 2,884,115 | | |
| විලම්බිත ආදායම සඳහා ක්‍රමක්ෂය ලැබීම් | | | | 47,915,337 | 59,520,683 | 71,119,936 | 66,254,496 | 89,532,996 | 91,763,105 | 52,558,303 |
| මුළු ආදායම | 149,308,424 | 192,130,261 | 206,376,310 | 317,605,985 | 385,404,481 | 405,254,567 | 461,891,371 | 497,096,997 | 525,593,115 | 622,782,069 |
| මුළු වියදම | 220,321,478 | 239,488,741 | 288,327,985 | 295,837,203 | 390,421,024 | 457,004,882 | 465,955,244 | 497,670,776 | 570,307,086 | 619,048,316 |
| වසර සඳහා අතිරික්තය /(ඌනතාවය) | (71,013,054) | (47,358,479) | (81,951,775) | 21,768,782 | (5,016,543) | (51,749,515) | (4,063,873) | (573,779) | (44,713,971) | 3,733,753 |
| | | | | | | | | | | |
| ජංගම නොවන වත්කම් | | | | | | | | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 413,181,215 | 434,871,745 | 437,451,967 | 525,409,154 | 592,759,143 | 648,761,979 | 683,851,212 | 628,033,936 | 2,197,273,747 | 2,128,008,592 |
| භාවිත අයිතිය - ගොඩනැගිලි | | | | | | | | | 61,855,799 | 64,665,583 |
| අස්පෘශ්‍ය වත්කම් | | | | | | | | | 7,460,979 | 5,718,506 |
| ස්ථාවර තැන්පතු | | | | | | 4,593,819 | 5,065,976 | 11,658,355 | 12,391,974 | 15,538,728 |
| ජංගම වත්කම් | | | | | | | | | | |
| කාර්යමණ්ඩල ණය | 7,299,959 | 6,456,621 | 8,507,849 | 12,008,331 | 12,540,685 | 13,167,510 | 15,195,354 | 12,627,161 | 13,189,183 | 13,959,113 |
| ඉන්වෙන්ට්‍රි , ලිපිද්‍රව්‍ය | 1,330,395 | 1,810,331 | 1,088,162 | 1,024,689 | 1,799,717 | 1,422,223 | 1,747,782 | 570,731 | 1,918,570 | 1,624,343 |
| පිරියත සහ උපකරණ | | | | | | | | | 187,089 | |
| අත්තිකාරම් සහ අනෙකුත් ලැබීම් | 23,016,165 | 27,986,450 | 27,992,790 | 63,306,415 | 77,829,168 | 32,654,272 | 69,926,113 | 34,261,785 | 22,376,953 | 26,997,939 |
| ආයෝජිත ගිණුම | 85,433 | 85,433 | 85,433 | 85,433 | 85,433 | 85,433 | 85,433 | 85,433 | 85,433 | 85,433 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1,447,272 | 20,530,849 | 32,097,454 | 3,262,800 | 15,479,150 | 15,589,028 | 15,579,135 | 30,877,801 | 16,534,868 | 69,288,990 |
| මුළු වත්කම් | 446,280,439 | 491,741,429 | 507,223,655 | 605,096,722 | 700,493,296 | 716,274,264 | 781,451,005 | 718,115,202 | 2,333,173,601 | 2,324,879,231 |
| හිමිකම සහ වගකීම් | | | | | | | | | | |
| ප්‍රාග්ධන සහ සංචිත (සංවර්ධන බදු) | | | | | | 3,576,819 | 5,584,122 | 11,658,355 | 12,960,393 | 13,188,117.00 |
| ප්‍රාග්ධනීකෘත අරමුදල | 622,470,805 | 786,670,223 | 736,621,992 | 749,318,173 | 830,564,132 | 822,051,587 | 802,744,130 | 788,025,807 | 809,753,648 | 767,159,832.00 |
| අනෙකුත් ප්‍රදාන | | | | | | | | 14,234,250 | | 6,584,250.00 |
| ශිෂ්‍යත්ව සවිය | | | | | | | | 1,628,640 | | 623,000.00 |
| KOIKA ප්‍රදාන | | | | | | | | | | 6,758,370.00 |
| රජයේ ප්‍රදාන AHEAD | | | | | | | | | 5,076,864 | 9,770,280.00 |
| ප්‍රාග්ධනීකෘත අරමුදල ආංශික සංවර්ධන ව්‍යාපෘතිය SSDP | | | 139,834,358 | 166,331,014 | 201,422,283 | 239,045,854 | 300,060,865 | 280,954,073 | 244,958,829 | 224,658,136.00 |
| ප්‍රාග්ධනීකෘත අතිරික්තය / ඌනතාවය | (322,689,668) | (384,274,070) | (466,618,875) | (435,126,654) | (445,391,295) | (514,416,548) | (518,985,846) | (528,338,308) | (573,655,678) | (613,013,812.00) |
| ප්‍රත්‍යාගණන සංචිත | | | | | | | | | 1,673,211,343 | 1,735,344,388.00 |
| විලම්බිත ආදායම්-ප්‍රදාන | | | | | | | | | 1,732,125 | 4,608,894.00 |
| HOPE මහසාගර ව්‍යාපෘතිය | | | | | | | | | | 45,000.00 |
| හිමිකම් එකතුව | 299,781,138 | 402,396,152 | 409,837,475 | 480,522,533 | 586,595,120 | 550,257,712 | 589,403,271 | 568,162,817 | 2,174,037,524 | 2,155,725,655.00 |
| ජංගම නොවන වගකීම් | | | | | | | | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 29,208,293 | 38,714,128 | 46,082,397 | 33,775,589 | 45,331,680 | 63,379,169 | 69,939,906 | 79,028,671 | 86,992,943 | 81,692,551.00 |
| ජංගම වගකීම් | | | | | | | | | | |
| උපචිත වියදම් | 115,147,665 | 48,388,632 | 48,553,176 | 87,206,982 | 55,834,256 | 83,644,548 | 101,359,285 | 50,356,737 | 47,313,085 | 27,427,422.00 |
| ගෙවිය යුතු දෑ | 2,143,344 | 2,242,517 | 2,750,608 | 3,591,619 | 13,002,239 | 18,993,833 | 20,748,541 | 20,566,974 | 14,721,063 | 14,709,513.00 |
| බදු සඳහා වෙන්කිරීම් | | | | | | | | | 10,108,975 | 24.00 |
| අනෙකුත් ජංගම වගකීම් | | | | | | | | | | 23,278,137.00 |
| විලම්බිත ආදායම | | | | | | | | | | 22,045,928.00 |
| ජංගම වගකීම් එකතුව | 117,291,009 | 50,631,149 | 51,303,784 | 90,798,601 | 68,836,495 | 102,638,381 | 122,107,826 | 70,923,711 | 72,143,123 | 169,153,575.00 |
| මුළු වගකීම් | 446,280,439 | 491,741,429 | 507,223,656 | 605,096,723 | 700,763,295 | 716,275,264 | 781,451,005 | 718,115,201 | 2,333,173,601 | 2,324,879,231.00 |

P.A.S. Nalin R. Perera
DIRECTOR FINANCE
Ocean University of Sri Lanka
Crow Island, Mattakkuliya,